# ''වාමාංශික'' ළදරු ගතිය සහ සුළු ධනපති චිත්ත ස්වභාවය

''වාම කොමියුනිස්ට්වාදීන්'' නැමති කුඩා කණ්ඩායමක් විසින් ඔවුන්ගේ ''කොමියුනිස්ට්[1] (අංක 1, 1918 අප්‍රේල් 20) සඟරාව පළ කරනු ලැබීමෙන් සහ ඔවුන්ගේ ''ප්‍රවාදවලින්, ''සෝවියට් ආණ්ඩුවේ හදිසි කර්තව්‍යයන්''*යන කුඩා පොතෙන් ප්‍රකාශිත මගේ අදහස් සිත්ගන්නා ලෙස සනාථ වී තිබේ. සමහර විට ''වාම'' සටන් පාඨවලින් මුවා කෙරෙන සුළු ධනපති මත්බව ආරක්ෂා කිරීමට යාමේ අන්ත බොළඳකම මීට වඩා හොඳින් සනාථ කිරීමක් දේශපාලන සාහිත්‍යයෙන් දක්ක නොහැකිය. අප දැන් ගත කරමින් සිටින කාල පරිච්ඡේදයේ ස්වභාවය ''වාම කොමියු-නිස්ට්වාදීන්'' ගේ තර්කවලින් නිරූපනය වන හෙයින්ද එම තර්ක මෙම කාල පරිච්ඡේදයේ ''අරටුවෙහි'' ප්‍රතිෂේධාත්මක පැත්ත ඉතාමත් පැහැදිලි ලෙස පිනු කර දක්වන හෙයින්ද ඒ ගැන විමසා බැලීම ප්‍රයෝජනවත් සහ අවශ්‍ය වන්නේය. අපගේ විමසිල්ලට භාජනව සිටින්නේ, වර්තමාන තත්වය වටහා ගැනීමට අසමත් වූවන් අතුරෙන් හොඳම අය, නැතහොත්, එම වැරදි අදහස් ගෙන එන සාමාන්‍ය නියෝජිතයන්ට වඩා දැනුම හා පක්ෂපාතිත්වය අතින් බොහෝ උසස් පිරිසක්වන වාම සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදීන් වන හෙයින් එම තර්ක උපදේශාත්මක වේ.

I

දේශපාලන කාර්ය කොටසක් ඉටු කිරීමට ඉදිරිපත් වන මහාර්ථයක් ලෙසට හෝ කණ්ඩායමක් ලෙසට හෝ ''වාම කොමියුනිස්ට්වාදී'' කණ්ඩායම එහි ''වර්තමාන තත්වය ගැන ප්‍රවාද'' ඉදිරිපත් කර තිබේ.

තමන්ගේ උපක්‍රමවලට මුල්ගල් වන ප්‍රතිපත්ති ගැන ගැලපීමෙන් යුතු සම්පූර්ණ විස්තරයක් කිරීම හොඳ මාක්ස්වාදී පුරුද්දකි. අපගේ ''වාම'' වාදීන් කරන වරද හෙළිදරව් කිරීමට මෙම පුරුද්ද ආධාරකාරී වී තිබේ. මක්නිසාද යත්, වාග් ප්‍රහාරයට නොව තර්කනයට ප්‍රයත්න දරූ පමණින්ම ඔවුන්ගේ තර්කයෙහි දූර්වලකම හෙළිදරව් වන හෙයිනි.

ප්‍රථමයෙන්ම අයෙකුගේ අවධානයට ලක් වන්නේ, බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීම හරිද යන පැරණි ප්‍රශ්නය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ව්‍යංගාර්ථයන්, ඉඟිකිරීම් හා මගහැරීම් බහුල බවය. එම ප්‍රශ්නය එක එල්ලේ ඉදිරිපත් කිරීමට තරම් ''වාම'' වාදීහු එඩිතර නොවෙති. ඔවුහු විකට ලෙසින් දනිපනි ගාති; තර්ක පිට තර්ක පටවති; කරුණු සොයා අතපත ගාති; ''එක් අතකින්'' එසේ විය හැකි නමුත් ''අනිත් අතින්'' එය එසේ විය නොහැකි යයි කියති; ඔවුන්ගේ සිතුවිලි සියළු සහ නියමයක් නැති මාතෘකා වටා දිවෙති; ඔවුහු තමන් ආත්මාභිභවනයෙහි යෙදෙනු නොදැකීමට සෑම මොහොතකම වෙහෙසෙති. සංඛ්‍යා විස්තර උපුටා දක්වීමට තරම් ''වාම'' වාදීහු සුපරීක්ෂාකාරී වෙති. පක්ෂ සම්මේලනයේදී සාමයට විරුද්ධව ඡන්ද දෙළහකි, පක්ෂව ඡන්ද විසි අටකි. නමුත්, සෝවියට් සභා සම්මේලනයේ බොල්ෂෙවික් කණ්ඩායමේ දී දෙන ලද සිය ගණනක් ඡන්දවලින් ඔවුන්ට ලැබුණේ දහයෙන් එකකටත් අඩු සංඛ්‍යා-වක් බව සඳහන් කිරීම, ඔවුහු සුපරීක්ෂා කාරී ලෙස මග හරිති. සාමය කරගහගෙන සිටින්නේ ''විඩාපත් සහ පංතියෙන් පිටදැමුනු කොටස්'' වන අතර ''ආර්ථික ජීවනයේ වැඩි ජීවබලයක් ඇති සහ පාන් සැපයුම වඩාත් විශ්වාසදායක වන දක්ෂිණ ප්‍රාන්තවල කම්කරුවෝ සහ ගොවියෝ'' ඊට විරුද්ධ වූහයි කියන ''න්‍යායක්'' ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ... මෙය අසා සිනාසීම හැර අයෙකුට කළ හැකි වෙනත් යමක් තිබේද? සාමයට පක්ෂව සමස්ත උක්‍රේනියා සෝවියට් සභා සම්මේලනයේදී දෙන ලද ඡන්දය ගැනවත්, සාමයට විරුද්ධ රුසියාවේ නියම සුළු ධනපති සහ පංතියෙන් පිටදැමුනු (වාම සමාජවාදී-විප්ලවවාදී පක්ෂය) දේශපාලන ලටපටයේ සමාජ සහ පංති ස්වභාවය ගැනවත් වචනයක්වත් නැත. ඔවුහු සිනහ උපදවන ''විද්‍යාත්මක'' විස්තරයන් කිරීමේ මාර්ගය උපයෝගි කර ගනිමින්, අන්ත ළදරු ගතියක් පාමින් තමන්ගේම බංකොලොත් භාවය සඟවා ගැනීමට, සත්‍ය කරුණු වසං කිරීමට උත්සාහ දරති. විප්ලව වාදී සුළු ධනපති වදන්මාලාවල දවටා ඉදිරිපත් කළ සටන්පාඨ මගින් සාමයට විරුද්ධ වූයේ පක්ෂයේ බුද්ධිමත් ''සාරය'' නැතහොත් අග්‍රයන්ම බවත්, සාමයට රුකුල් දුන්නේ කම්කරුවන්ගෙන් සහ සූරාකනු ලබන ගොවීන්ගෙන් සැදුනු පොදු ජනතාවම බවත්, හුදෙක් සත්‍ය කරුණු සමාලෝචනය කළ පමණින්ම පෙනී යනු ඇත.

එසේ වී නමුත්, යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නය ගැන වූ ''වාම'' වාදීන්ගේ ඉහත සඳහන් සියළුම ප්‍රකාශයන් හා මගහැරීම් මධ්‍යයේම, සරල සහ පැහැදිලි සත්‍යය එළි දකින්නේය. ''ලෝක පරිමාණයෙන් ගනුදෙනු බේරුම් කර ගැනීමට අධිරාජ්‍යවාදීන් දරන ප්‍රයත්න තාවකාලික වශයෙන් දුර්වල වීමක් සාමය ඇතිකර ගැනීම නිසා ඇති වූ ''බව'' පිළි නොගෙන සිටීම ප්‍රවාදවල කතුවරුන්ට නොහැකි විය. (''වාම'' වාදීන් මෙය වැරදි ලෙස වදන් ගත කර ඇති නමුත්, මෙය වැරදි හැඳීමට තැන නොවේ). ''සාමය ඇති කර ගැනීම නිසා, දැනටමත් අධිරාජ්‍යවාදී බලවතුන් අතර ගැටුම තවත් උග්‍රවීමට හේතුවී ඇත.''

මෙය සත්‍යයකි. තීරණාත්මක වැදගත් කමක් සහිත දෙයක් මෙහි ඇත. සාමය ඇතිකර ගැනීමට විරුද්ධ වූ අය, නොදැනුවත්වම අධිරාජ්‍යවාදීන් අතෙහි කෙළි බඩු වූ බවත්, අධිරාජ්‍යවාදීන් ඇටවූ උගුලට ඔවුන් හසු වූ බවත් කියන්නේ එහෙයිනි. මන්දයත්, එක රටක් (විශේෂයෙන්ම, නොදියුණු රටක්) ජයග්‍රහණය කරගත් සමාජවාදීන්ගේ සෘජු යුතු කම, ලෝක සමාජවාදී විප්ලවය හට ගන්නා තෙක්, එය රටවල් කීපයකම පැතිරගොස් ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය මැඩලීමට තරම් ශක්තිමත් වන තෙක්, අධිරාජ්‍යවාදී දුවැන්තයන්ට විරුද්ධව සටන පිළි නොගැනීම වන හෙයිනි. ඔවුන්ගේ යුතුකම වන්නේ සටන මගහැරීමට උත්සාහ දැරීමය; අධිරාජ්‍යවාදීන් අතර ගැටුම් නිසා ඔවුන් තව දුරටත් දුර්වල වන තෙක් සහ වෙනත් රටවල විප්ලව තව තවත් ආසන්න වන තෙක් සිටීමය. ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසවලදී අපගේ ''වාම'' වාදීන්ට මෙම සරල සත්‍යය වැටහුනේ නැත. දැන් වුවද, එය විවෘත ලෙස පිළි ගැනීමට ඔවුහු බිය වෙති. නමුත් ''එක් අතකින් පාපෝච්චාරණය කළ යුතුය; අනිත් අතින් අයෙක් පිළිගත යුතුය''[2] යනාදි වශයෙන් වූ ඔවුන්ගේ මුළු අවුල් තර්කනයෙන්ම එම සත්‍යය දහවල් එළියට ඇදෙන්නේය.

''වාම'' වාදීහු ඔවුන්ගේ ප්‍රවාදවල මෙසේ ලියති:

''ලබන වසන්තයේදී සහ ග්‍රීෂ්මහානයේදී අධිරාජ්‍යවාදී ක්‍රමයේ බිඳ වැටීම ආරම්භ විය යුතුය. යුද්ධයේ වර්තමාන අදියරෙහි දී ජර්මන් අධිරාජ්‍යවාදයට ජය ලැබුණ හොත් එයින් සිදු විය හැක්කේ බිඳ වැටීම කල් යාමක් පමණකි. නමුත්, එසේ වුවහොත් බිඳ වැටීම තව තවත් උග්‍ර ආකාරයෙන් සිදු වනු ඇත.

මෙම වදන් ගත කිරීමෙන්, විද්‍යානුකූල වීමේ ක්‍රීඩාව කරනු ලැබෙතත්, එය වැඩි වැඩියෙන්ම ළදරු කම පාන සේ වැරදි සහගත වේ. විද්‍යාව යනු ''බිඳ වැටීම ආරම්භ විය යුතු'' වර්ෂයත්, ඒ වසන්තයේද, ග්‍රීෂ්මහානයේද, සරත් සමයේද, නැතහොත් ශීත කාලයේද යනුත් තීරණ කිරීමෙහි තමන් සමත් බව ළදරුවන් විසින් වටහා ගනු ලැබීම ස්වාභාවිකය.

මේවා නම්, නිශ්චය කළ නොහැකි දේ නිශ්චය කිරීමට දරන නිරර්ථක ප්‍රයත්නයන් ය. ''ක්‍රමයක'' මෙම හෝ අනිත් බිඳ වැටීම ''ආරම්භ විය යුත්තේ'' කවදාද යනු, බරපතල ලෙස සිතන කිසිම දේශපාලනඥයෙක් කිසි කලෙකත් නොකියනු ඇත. (ක්‍රමයේ බිඳ වැටීම දැනටමත් ආරම්භ වී තිබෙන අතර, දැන් ප්‍රශ්නය වී තිබෙන්නේ එක් එක් රටවල විප්ලවය හටගැනීම ඇරඹෙන්නේ කුමණ අවස්ථාවේද යන්න වන හෙයින් විශේෂ-යෙන් ම අයෙක් කිසිසේත්ම එසේ නොකියනු ඇත). නමුත් ළදරුවෙකු මෙන් කරන අසරණ වදන්ගත කිරීම තුළින් මතු වී ඉදිරියට එන සත්‍යයක් වේ. එය නම්, වෙනත්, වඩාත් දියුණු රටවල විප්ලවීය දෙදරායම් දැන්, ''විවේකය'' ඇරඹීමාසයක් ගතවීමෙන් පසුව, මාසයකට හෝ සති හයකට පෙර තිබුණට වඩා ආසන්න වී තිබෙන බවය.

මෙයින් වැටහෙන්නේ කුමක් ද?

මෙයින් වැටහෙන්නේ සාමයට රුකුල් දුන් අය සම්පූර්ණයෙන්ම නිවැරදි බවත්, ඔවුන් ගත් ස්ථාවරය සාධාරණ බව සිද්ධි මාර්ගය අනුව පෙනී ගොස් ඇති බවත්ය. සමාජවාදය තවමත් දුර්වලව තිබෙන කල, සටනෙන් වාසිලැබෙන්නේ සමාජවාදයට විරුද්ධ අයට බව පැහැදිලිව පෙනෙන විට, අයෙක් බලතුලනය තක්සේරු කර බැලිය යුතු යයි ද සමාජවාදයට විරුද්ධව අධිරාජ්‍යවාදීන් කරන සටන පහසු කිරීමෙන් ඔවුන්ට ආධාර නොකළ යුතු යයි ද, නුවුවමනා වීරත්වය පෑමට ආශා කරන අයගේ සිත් තුළට කාවැද්දීමෙන් සාමයට පක්ෂවූවන් කළේ නිවැරදි දෙයකි.

එසේ වුවද, තමන් ''නිර්ධන පංති'' කොමියුනිස්ට්වාදීන් යයි කියා ගැනීමට රුචි වන අපගේ ''වාම'' කොමියුනිසට්වාදීහු, ඔවුන් තුළ ඇති නිර්ධන පංතිභාවය ඉතා අල්ප සහ සුළු ධනපති කම ඉතා අධික නිසා, බල තුලනය ගැන සිතීමට හෝ එය තක්සේරු කිරීමට හෝ සමත් නො-වෙති. මෙය මාක්ස්වාදයේ සහ මාක්ස්වාදී උපක්‍රමවල අරටුව වෙතත්, ''අරටුව'' වටේ යන ඔවුහු පහත සඳහන් වැනි ''ආඩම්බර'' වදන් දෙසති:

''... අක්‍රිය ''සාමයක චිත්ත ස්වභාවය'' පොදු ජනතාවගේ සිත් තුළට තදින් කාවැදී තිබීම, පවතින දේශපාලන තත්වයේ වාස්තවික තත්වයකි...''

මෙය මාණික්‍යයකි! හුදු වදන් නිර්මාණය දක්වා කිසි කලෙකත් පහත නොවැටුනු සෝවියට් බලයේ නිවැරදි උපක්‍රමවලට ස්තුති වන්නට, ජනතාව, මහත් වේදනාකාරී සහ ප්‍රතිගාමී යුද්ධයේ තුන් අවුරුද්දකින් පසුව ඉතාමත් කෙටි, ආරක්ෂා රහිත සහ කොහෙත්ම ප්‍රමාණවත් නොවන විවේකයක් ලබා ගත්හ. එසේ නමුත්, ආත්ම මෝහනයට පත් නාර්වසිස් [3]

කෙනෙකුගේ උදරම්කමක් පාමින් ''වාම'' බුද්ධිමත් කොලු ගැටයෝ ''අක්‍රිය (!?) සාමයක චිත්ත ස්වභාවය පොදු ජනතාවගේ (!??) සිත් තුළට කා වැදී තිබීම (!!!)'' ගැන ගාම්භීර ලෙස කථා කරති. ''වාම'' වාදීන්ගේ පත්‍රයට, නැතහොත්, සඟරාවට දිය යුතුව තිබුණු නම ''කොමියුනිස්ට්'' නොව ''ෂ්ලැයහ්තිච්* යන්න බව පක්ෂ සම්මේලනයේදී මා කීවා නිවැරදි නොවේද?

වෙහෙසෙන සහ සූරාකනු ලබන ජනතාවගේ චිත්ත ස්වභාවය සහ ජීවන තත්වයන් ගැන මඳකුදු වැටහීමක් ඇති කොමියුනිස්ට්වාදියෙකුට, ''සාමයක චිත්ත ස්වභාවය'' ''අක්‍රිය'' බව කියන සහ කාඩ්බෝඩ් කඩුවක් වැනීම ''ක්‍රියා කාරිත්වය'' යයි සිතන වංශවතෙකුගේ, නැතහොත් ෂ්ලැයහ්ති මානසික දැක්මක් ඇති හා නියම වශයෙන්ම පංතියෙන් පිටත දැමුනු සුළු ධනපති බුද්ධිමතාගේ අදහස් දක්වා පහත වැටෙන්නට හැකිද? උක්‍රේනියාවේ යුද්ධයෙන් වැඩි දුරටත් ඔප්පුවූ පරිදි තුන් අවුරුද්දක සාතනයෙන් අන්ත විඩාවට් පත්ව සිටින ජනතාවට විවේකයක් නැතිව දිගටම සටන් කළ නොහැකි බව නොතකා හරින අපගේ ''වාම'' වාදීන් එයින් කරන්නේ කාඩ්බෝඩ් කඩුවක් වැනීම ය. තවද එම යුද්ධය ජාතික පරිමාණයෙන් සංවිධානය කළ නොහැකි නම්, එයින් බොහෝ විට ඇති වන්නේ නිර්ධන පංතියේ අයෝමය විනය නොව, සුළු දේපල හිමියන්ට විශේෂ වූ බිඳී විසිරී යාමේ චිත්ත ස්වභාවයකි. අපගේ ''වාම'' වාදීන්ට නිර්ධන පංතියේ අයෝමය විනය ගැන හා එය ඇති කරගන්නේ කෙසේද යන්න ගැන, කිසිම වැටහීමක් නොමැති බවත්, පංතියෙන් පිට දැමුනු සුළු ධනපති බුද්ධිමතාගේ චිත්ත ස්වභාවය ඔවුන් තුළට තදින් කාවැදී ඇති බවත් ''කොමියුනිස්ට්'' සඟරාවේ සෑම පිටුව කින්ම පෙනේ.

## II

සමහර විට ''වාම'' වාදීන්ගේ මෙම යුද්ධය ගැන වූ වදන්, වැඩි කොටම අතීතයට බලපාන හුදු ළදරු මනෝරංජනයක් සේ ගෙන, ඒ අනුව, එහි දේශපාලන වැදගත්කම පිළිබඳ ඡායා මාත්‍රයක්වත් නොමැති යයි සැලකිය හැකි ද? නමුත් මෙය වැරදිය. දේශපාලන නායකත්වය ගැනීමට බලාපොරොත්තුවන ඕනෑම කෙනෙක් දේශපාලන ගැටළු ගැන සිතා බැලීමට සමත් විය යුතුය. ''වාම'' වාදීන්ට මෙම හැකියාව නොමැති හෙයින් ඔවුහු චපලත්වයේ ප්‍රතිපත්තියක කොන්ද පණ නැති දේශකයන් බවට පත් වෙති. එම ප්‍රතිපත්තියෙන් ඇති විය හැක්කේ එක ප්‍රතිඵලයක් පමණකි. එය මෙසේය: නිසැක ලෙසම රුසියානු සෝවියට් සමූහාණ්ඩුවට අවාසිදයක

* පෝලන්ත වංශවතෙකි. — පරිවර්තක

වන යුද්ධයකට එය ඇද දැමීම පිණිස ''වාම'' වාදීහු ඔවුන්ගේ චපලත්වයෙන් අධිරාජ්‍යවාදීන්ට ආධාර කරති. අප උගුලකට හසු කර ගැනීම සඳහා ඔවුහු අධිරාජ්‍යවාදීන්ට ආධාරකරති. දැන් මෙයට කන් දෙන්න:

''... ලෝක විප්ලවයේ මාර්ගය අත්හැර දැමීමෙන්. එක දිගටම සටන මග හැරීමෙන් හා ''දේශීය ප්‍රාග්ධනයට'' සහන සැල සීම මගින් ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ බල පෑමට යට වීමෙන්, රුසියානු කම්කරු විප්ලවයට ''ගැලවී ගත'' නොහේ.

''මේ අනුව බලන කල, වචනයෙන් සහ ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය හා සම්බන්ධ කරන අධිෂ්ඨාන සහගත පංතිමය ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් පිළිගැනීම සහ ජාත්‍යන්තර සමාජවාදය සමග (ජාත්‍යන්තර ධනපති පංතිය සමග නොව) ඓන්ද්‍රිය සම්බන්ධය ශක්තිමත් කිරීම අවශ්‍ය වන්නේය...''

මෙම ඡේදය මගින් දේශිය ප්‍රතිපත්තියට අනිත පහරවල් ගැන මම වෙනම කරුණු සඳහන් කරන්නෙමි. නමුත් විදේශ ප්‍රතිපත්තියේ ක්ෂේත්‍රයෙහි කර ඇති මෙම වදන් හරඹ තොවිලය හා ක්‍රියාවෙන් දක්වන බියසුලු ගතිය පරීක්ෂා කර බලන්න. අධිරාජ්‍යවාදී ප්‍රකෝප කිරීමේ අතකොලු වීමට නොකැමති සහ උගුලට පය ඇමීමට නොකැමති අය වර්තමානයේදී අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු උපක්‍රම මොනවාද? සෑම දේශපාලනඥයෙක්ම මෙම ප්‍රශ්නයට පැහැදිලි සහ ඍජු පිළිතුරක් දිය යුතුය. එයට අප පක්ෂය දෙන පිළිතුර සුප්‍රසිද්ධ ය. වර්තමාන අවස්ථාවේදී අපි පසුබැසිය යුත්තෙමු; සටන මගහැරිය යුත්තෙමු. මෙය ප්‍රතික්ෂේප කිරීමට තරම් එඩිතර කමක් නොදක්වන අපගේ ''වාම'' වාදීහු අහසට වෙඩි තබති: ''අධිෂ්ඨාන සහගත පංතිමය ජාත්‍යන්තර ප්‍රතිපත්තියක්''!!

මෙය නම් ජනතාව රැවටීමකි. ඔබට උමනා කරන්නේ දැන් සටන් කිරීමට නම්, ඒබව විවෘත ලෙස කියන්න. දැන් පසුබැසීමට ඔබ අකැමති නම්, ඒබව විවෘතව කියන්න. ඔබ එසේ නොකරන්නෙහි නම්, ඔබ ඉටු කරන වාස්තවික කාර්ය කොටස අනුව ඔබ අධිරාජ්‍යවාදී ප්‍රකෝප කිරීමෙහි අත කොලුවක් වන්නේය. එවිට ඔබගේ මනෝමූල ''චිත්ත ස්වභාවය'' අනිකක් නොව, උඩඟුකම් පාන සහ පුරාජේරු දෙඩන එහෙත්, පසුබැසීමෙන් හා සංවිධානත්මක ලෙස පසු බැසීමට උත්සාහ කිරීමෙන් නිර්ධන පංතිකයා කරන දේ නිවැරදි යයි සම්පූර්ණයෙන්ම හඟින, උන්මත් සුළු ධනපති පංතිකයාගේ චිත්ත ස්වභාවයමය. බටහිර විප්ලවය (''වාම'' වාදීන්ගේ නන්දෙඩවිලි ඇසුනත්) ''වසන්තයේ හෝ ගිම්හානයේ'' අනිවාර්යයෙන්ම ආරම්භ වීම ''විය යුතු'' නොවුවත්, එය සමීප වෙමින් සහ සෑම මාසයක්ම පාසා අනුමානය දුරු වී යන ලෙසින් මෝරා එමින් පවතිද්දී,

කාලය ලබා ගැනීමේ එකම අවස්ථාව රැඳී පවතින්නේ පසු බැසීම තුළ වන අතර, අපට ශක්තිය මදි නිසා උරල් කඳු දක්වා වුවද (බටහිර හා නැගෙන හිර අධිරාජ්‍යවාදය හමුවේ) අප පසු බැසිය යුතු යයි කියමින් තර්ක කරන නිර්ධන පංතිකයා නිවැරදි බව සුළු ධනපතියා හඟියි.

''වාම'' වාදීන්ට ''ස්වකීය'' ප්‍රතිපත්තියක් නැත. මෙම මොහොතේදී පසුබැසීම අනවශ්‍ය යයි කීමට තරම් ඔවුහු එඩිතර නොවෙති. ඔවුහු හැරෙති. පෙරලෙති. වචනවලින් ක්‍රීඩා කරති. මෙම මොහොතේ සටන මඟහැරීමේ ප්‍රශ්නය වෙනුවට ''එක දිගටම'' සටන මඟහැරීම ආදේශ කරති. ඔවුහු ''ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය'' ගැන සබන් පෙන පිඹිති!! මෙහි අර්ථය කුමක්ද?

එහි අර්ථය විය හැක්කේ දෙකකින් එකක් පමණකි. එක්කෝ එය හුදෙක්ම නස්ද්‍රියොාව්වාදය ය[4] . නැතහොත් එයින් අදහස් කරන්නේ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පෙරළා දැමීමට ආක්‍රමණික යුද්ධයක් කළ යුතු බවය. මෙවැනි විකාරයන් විවෘත ලෙස ප්‍රකාශ කළ නොහැකිය. දේශපාලන විඥානය ඇති සෑම නිර්ධන පංතිකයෙකුගේම සමච්චලයෙන් බේරීමට මහා ශාබ්දික සහ පුහු වදන් පිටුපස මුවා වීමට ''වාම'' කොමියුනිස්ට්වාදීන්ට සිදුවන්නේ එහෙයිනි. ''ක්‍රියාවෙන් කරන ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රචාරය'' යන වාක්‍ය කොටසෙහි අර්ථය අපරීක්ෂාකාරී පාඨකයාට හසුනොවෙතැයි ඔවුහු අපේක්ෂා කරති.

මහා ශාබ්දික වදන්වලින් ජේත්තුවීම පංතියෙන් පිට දැමුනු සුළු ධනපති බුද්ධිමතුන්ගේ ගුණාංගයකි. නිර්ධන පංතික කොමියුනිස්ට්වාදීන් මෙම ''පුරුද්දට'' දෙන්නේ නිසැකවම සමච්චල් කිරීමට සහ වගකිවයුතු නිලවලින් පහ කිරීමට නො අඩු දඬුවමකි. ජනතාවට සරල ලෙස, පැහැදිලි ලෙස හා ඍජු ආකාරයෙන් අමිහිරි සත්‍යය කිව යුතුය. ජර්මනියේ යුද්ධකල්ලිය නැවතත් ප්‍රබලවීමට (එවිට අප්‍රමාදව අපට විරුද්ධව ප්‍රහාරයක් ඇරඹෙනු ඇත) හා ජර්මනියත්, ජපානයත් එක්ව නිල ගිවිසුමක් මගින් හෝ නිහඬ එකඟත්වයෙන් අපගේ රට බෙදගෙන අපගේ ගෙල මිරිකා දැමීමට ඉඩ තිබෙනවා පමණක් නොව, එය සිදු විය හැකිද දෙයකි. මැත දෙඩන්නන්ට ඇහුම්කන්දීමේ උවමනාවක් අපට නොමැති නම්, අපගේ උපක්‍රම විය යුත්තේ, ප්‍රමාදවීම, සටන මග හැරීම සහ පසුබැසීමය. අපි මැත දෙඩනවුන් ඉවතට තල්ලු කර දමා, සැබැවින්ම අයෝමය, නියම වශයෙන්ම නිර්ධන පංතික සහ ඇත්තෙන්ම කොමියුනිස්ට්වාදී විනයක් ඇතිකර ගැනීමෙන් අපගේ ''ශක්තිය වර්ධනය කර ගන්නෙමු'' නම්, අපට මාස කීපයක් කාලය ලබා ගැනීමේ හොඳ අවස්ථාවක් ඇත. එවිට (තත්වය නරකින් නරකට ගියත්) අපි උරල් කඳු දක්වා පසු බැසීමෙන් වුව, අපගේ ආධාරයට ඒමත්, විප්ලවය සහ විප්ලවවාදී ඉදිරි ගමනාරම්-

හයත් අතර දුර (ක්‍රීඩාවලදී යෙදෙන වචනයක් ගනිතොත්) ''ඇල්ලීමටත්'' අපගේ මිතුරාට (ජාත්‍යන්තර නිර්ධන පංතියට) පහසු කරන්නෙමු.

ජාත්‍යන්තර සමාජවාදයේ තාවකාලික වශයෙන් තනි වූ කොටසත්, එහි අනිකුත් කොටසුත් අතර සම්බන්ධය ශක්තිමත් කළ හැක්කේ මෙම උපක්‍රම මගිනි-එමගින් ම පමණකි. නමුත් හිතවත් ''වාම කොමියුනිස්ට්-වාදීනි'', ඔබගේ තර්ක සියල්ලම යොමුවන්නේ එක් මහා ශාබ්දික වදනක් සහිතව එකක් අතර''ඓන්ද්‍රිය සම්බන්ධය ශක්තිමත් කිරීමට'' පමණක්ය යන සත්‍යය ඔබට කියන්නෙමු. මෙය නම් නරක තාලයක ''ඓන්ද්‍රිය සම්බන්ධයකි''!

මගේ ප්‍රියමනාප මිත්‍ර වරුනි, මෙවන් ව්‍යසනයකට ඔබ හසු වූයේ කෙසේදැයි ඔබට පැහැදිලි කර දෙන්නෙමි. එසේ වූයේ විප්ලවවාදී සටන් පාඨ ගැන සිතා බලනවාට වඩා ඔබ ඒවා කටපාඩම් කරන හෙයිනි. එනිසා උපුටා දැක්වීමේ ලකුණු සහිතව ''පිතෘ භූමිය ආරක්ෂා කිරීම'' ගැන ලිවීමට ඔබ යොමුවන්නෙහිය. එම ලකුණු යෙදීමෙන් ඔබ සමහර විට අදහස් කරන්නේ උපහාසය දැනවීමට උත්සාහ දැරීමක් විය හැකි නමුත්, එයින් ඇත්ත වශයෙන් ඔප්පුවන්නේ ඔබ ඔල්මාද කාරයන් බවය. ''ආරක්ෂා-වාදය'' පහත් හා පිළිකුල් සහගත දෙයක් ලෙස සැලකීමට ඔබ පුරුදු වී සිටී. ඔබ මෙය උගෙන ගෙන කටපාඩම් කරගත්තෙහි ය. ඔබ කොතරම් දුරට එය කට පාඩම් කරගත්තෙහිද යත්, අධිරාජ්‍යවාදී යුගයකදී පිතෘභූමිය ආරක්ෂා කිරීම නොකළ හැකි දෙයකැයි යන අර්ථය දෙන ප්‍රලාප දෙඩීමට ඔබ සමහර දෙනෙක් යොමුවන්නෙහිය (ඇත්ත වශයෙන් එය නොකළ හැක්කේ ධනපති පංතිය කරන අධිරාජ්‍යවාදී යුද්ධයකදී පමණකි). ''ආරක්ෂාවාදය'' පිළිකුල් සහගත වන්නේ මන්ද, ඒ කුමණ අවස්ථාවකද යන්න ඔබ සිතා බලා නැත.

පිතෘ භූමියේ ආරක්ෂාව පිළිගැනීම යනු යුද්ධයේ සාධාරණත්වය හා යුක්ති යුක්ත භාවය පිළිගැනීම වේ. ඒ කුමණ දෘෂ්ටි කෝණයකින් සාධා-රණත්වය හා යුක්ති යුක්ත භාවයද? ඒ සමාජවාදී නිර්ධන පංතියේ සහ විමුක්තිය සඳහා එය කරන අරගලයේ දෘෂ්ටි කෝණයෙන් පමණකි. අපි වෙනත් කිසිම දෘෂ්ටි කෝණයක් පිළි නොගන්නෙමු. යුද්ධය කරනු ලබන්නේ සූරා කන පංතිය විසින් එහි පංති පාලනය ශක්තිමත් කිරීමට නම්, එවැනි යුද්ධයක් සාපරාධී යුද්ධයකි. එවැනි යුද්ධයකදී ''ආරක්ෂාවා-දය'' යනු පහත් ලෙස සමාජවාදය පාවා දීමකි. යුද්ධය කරනු ලබන්නේ තම රටෙහි ධනපති පංතිය පරාජය කළ නිර්ධන පංතිය විසින් සමාජවාදය ශක්තිමත් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව නම්, එවැනි යුද්ධයක් සාධාරණ සහ ''ශුද්ධ'' යුද්ධයකි.

1917 ඔක්තෝබර් 25 දින පටන් අපි ''ආරක්ෂාවාදීන්'' වූයෙමු. මම

මෙය වරකට වැඩිය සහ ස්ථිර වශයෙන්ම කීවෙමි. එය ප්‍රතික්ෂේප කිරීමට තරම් ඔබ එඩිතර නොවන්නෙහිය. සමාජවාදී පිතෘ භූමිය ආරක්ෂා කිරීමේ යුතුකමට අප බැඳී සිටින්නේ නියත වශයෙන්ම ජාත්‍යන්තර සමාජවාදය සමග "සම්බන්ධය ශක්තිමත් කිරීමේ" අවශ්‍යතාවය විසින්මය. දැනටමත් නිර්ධන පංතිය විසින් ජයග්‍රහණය කර තිබෙන රටක් ආරක්ෂා කිරීම ගැන නොසැලකිල්ලක් දක්වා කටයුතු කරන්නහු ජාත්‍යන්තර සමාජවාදය සමග සම්බන්ධය විනාශ කරන්නෝ වෙති. අපි පීඩනයට භාජනයව සිටි පංතියක්ව සිටි කල්හි, අධිරාජ්‍යවාදී යුද්ධයක දී පිතෘ භූමිය ආරක්ෂා කිරීම ගැන නොසැලකිලි ආකල්පයක් නොදැක්වූයෙමු. අපි එවැනි ආරක්ෂාවට ප්‍රතිපත්තියක් වශයෙන් විරුද්ධ වූයෙමු. දැන් අපි සමාජවාදය සංවිධානය කිරීම ආරම්භ කර සිටින පාලක පංතියේ නියෝජිතයන් වන නිසා, රට ආරක්ෂා කිරීම ගැන බරපතල ආකල්පයක් ඇතිව සියළු දෙනාම කටයුතු කළයුතු යැයි බල කරන්නෙමු. තවද, රට ආරක්ෂා කිරීම ගැන බරපතල ආකල්පයකින් කටයුතු කිරීම යනු ඒ සඳහා තරයේ සූදනම් වීම සහ බලවේග තුලනය ඇති සැටියෙන්ම තක්සේරු කිරීම වේ. අපගේ බලවේගයන් කුඩා බව නිසැක නම්, ආරක්ෂාව සඳහා ගතයුතු හොඳම මාර්ගය රට අභ්‍යන්තරයට පසු බැසීමය. (මෙය අවස්ථාවේ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට කෘතිම වශයෙන් නිමවාගත් සූත්‍රයක් යැයි සිතන කෙනෙක් වේ නම්, යුද්ධ කටයුතු ගැන ශ්‍රේෂ්ඨ වියතෙක් වන පැරණි ක්ලවුසෙවිට්ස් ගේ කෘතිවලින් මේ සම්බන්ධයෙන් ඉතිහාසයෙන් උගත යුතු පාඩම් ගැන කියවිය යුතුය). එසේ නමුත්, බලවේග තුලනය පිළිබඳ ප්‍රශ්නයේ වැදගත් කම ගැන "වාම කොමියුනිස්ට් වාදීන්ට" වැටහීමක් තිබෙන බවට සලකුණක් වත් ඔවුන් කෙරෙහි දක්නට නැත.

අප ආරක්ෂාවාදයට, ප්‍රතිපත්තියක් වශයෙන්, විරුද්ධව සිටි කල්හි, සමාජවාදයේ අවශ්‍යතාවයන් නාමයෙන් ස්වකීය පිතෘ භූමිය "බේරා ගැනීමට" ඉදිරිපත් වූවන්ට අප කළ සමච්චලය යුක්ති යුක්ත විය. අප නිර්ධන පංති ආරක්ෂාවාදීන් වීමේ අයිතිය දිනාගත් පසු මුළු ප්‍රශ්නයම මූලික වශයෙන් වෙනස් විය. අදළ විවිධ බලවේගයන් ගැන ඉතාමත් නිවැරදි ලෙස තක්සේරු කිරීම සහ කල් වේලා ඇතිව අපගේ ආධාරයට ඒමට අප මිතුරාට (ජාත්‍යන්තර නිර්ධන පංතියට) ඇති ඉඩ කඩ ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස මැන බැලීම අපගේ යුතු කම වී තිබේ. සියළුම රටවල කම්කරුවන් එක්සත් වීමට (ඇත්ත වශයෙන්ම එක්සත් වීමට, එනම් විප්ලවය ආරම්භ කිරීමට) පෙර සතුරා (ජාත්‍යන්තර නිර්ධන පංතිය) ටිකෙන් ටික විනාශ කිරීම ප්‍රාග්ධනයේ උවමනාව වන්නේය. විප්ලවවාදී කම්කරු සේනාංකයන් එකම මහා ජාත්‍යන්තර හමුදවකට එක්සත් වන මොහොත (නැතහොත් එම මොහොතෙන් පසු අවස්ථාවක්) දක්වා

තීරණාත්මක සටන කල් දැමීමට ලැබෙන ඉතාමත් සුළු අවසරයෙන් පවා ප්‍රයෝජන ගැනීමට හැකි සියල්ලක්ම කිරීම අපගේ යහපත පිණිස වන්නේය.

III

අපි, අපගේ ''වාම'' කොමියුනිස්ටවාදීන්ට ස්වදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙහිදී අත් වී තිබෙන අභාග්‍යය වෙත හැරෙමු. වර්තමාන තත්වය ගැන වූ ප්‍රවාදවල එන පහත සඳහන් වාක්‍ය කොටස කියවන විට සිනහ නොවී සිටීම දුෂ්කරය.

''... ඉතිරි නිෂ්පාදන මාධ්‍යයන්ගෙන් ක්‍රමානුකූල ලෙස ප්‍රයෝජන ගැනීම ගැන සිතන්නට හැක්කේ ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහොත් පමණකි''... ''ධනපති පංතියට සහ එහි සුළු ධනපති බුද්ධිවාදී පරිවර්තයන්ට යටත් නොවී ධනපති පංතිය අන්ත පරාජයට පත්කර කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීමට...''

ප්‍රිය මනාප ''වාම කොමියුනිස්ටවාදීන්'' කොතරම් අධිෂ්ඨාන සහගත වූවත් ඔවුන් පෙන්නුම් කරන කල්පනාකාරිත්වය ඉතාමත් ඉල්පය. ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'' අනුගමනය කිරීම යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ කුමක්ද?

ජනසතු කිරීම, නැතහොත්, රාජ්‍ය සන්තක කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී, අයෙකුට අධිෂ්ඨාන සහහත වීමට හෝ නොවීමට හෝ හැකිය. නමුත් වැදගත් කාරණය වන්නේ ජනසතු කිරීමේ සහ රාජ්‍ය සන්තක කිරීමේ සිට සමාජ සන්තක කිරීම වෙත යාමට, ඇතිකර ගත හැකි විශාලතම ''අධිෂ්ඨානය'' වූවද ප්‍රමාණවත් නොවන බවය. අපගේ ''වාම'' වාදීන්ගේ අභාග්‍යය වන්නේ, ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'' යන වචන බොළඳ හා ලාමක ලෙස එකට තැබීමෙන් ප්‍රශ්නයේ අරටු කොටස, එනම්, ''වර්තමාන'' තත්වයේ හරය වටහා ගැනීමට ඇති ඔවුන්ගේ අන්ත අසමර්ථතාවය හෙළිදරව් කිරීමය. අපගේ ''වාම'' වාදීන්ගේ අභාග්‍යය වන්නේ, ''වර්තමාන තත්වයේ'', එනම්, රාජ්‍ය සන්තක කිරීමේ (එය ක්‍රියාත්මක කිරීම සඳහා අන් සියල්ලටම වඩා දේශපාලනඥයෙකුගේ අධිෂ්ඨානය අවශ්‍ය වේ) සිට සමාජ සන්තක කිරීම (එය ක්‍රියාත්මක කිරීම සඳහා විප්ලවවාදියෙකුට වෙනත් ගතිගුණ අවශ්‍යය) දක්වා යාමේ මුළු සාරාර්ථයම ඔවුන්ට මගහැරී යාමය.

ඊයේ දින ව්‍යාපාරයේ ප්‍රධාන කර්තව්‍යය වූයේ හැකි තරම් අධිෂ්ඨාන

සහගත ලෙස ජනසතු කිරීම, රාජ්‍ය සන්තක කිරීම, ධනපති පංතිය තලා දැමීම හා පොඩිපට්ටම් කර දැමීම සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීම විය. අපට තක්සේරු කිරීමට පවා කාලයක් නොමැති වන තරමට අප ජනසතුකර, රාජ්‍ය සන්තක කර, තලා දමා සහ පොඩි පට්ටම් කර දමා තිබෙන බව අද නොපෙනෙනු ඇත්තේ අන්ධයෙකුට පමණකි. සරල රාජ්‍ය සන්තක කිරීම සහ සමාජ සන්තක කිරීම අතර ඇති වෙනස නම්, ගණන් බැලීමේ සහ නිසි ලෙස බෙදා හැරීමේ හැකියාව නොමැතිව, ''අධිෂ්-ඨානයෙන්'' පමණක් රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කළහැකි නමුත්, එම හැකියාව නොමැතිව සමාජ සන්තක කිරීම ක්‍රියාත්මක කළ නොහැකි වීමය.

ඊයේ දින අප ඉටු කළේ රාජ්‍ය සන්තක කිරීමේ දී, ධනපති පංතිය තලා දැමීමෙහි දී සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීමේ දී අධිෂ්ඨානය දැක්වීමේ ඓතිහාසික සේවය ය (හෙටද අපි එය ඉටු කරන්නෙමු). අද ''වර්තමාන තත්වය ගැන ප්‍රවාද'' වල මේ ගැන ලිවීම යනු අයෙකුගේ බැල්ම අතීතය වෙත සවි කරගෙන සිටිමින්, අනාගතයට පරිවර්තනය වීම ගැන අවබෝධ කර ගැනීමට අසමත්කම දැක්වීම වේ.

''... කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීම...'' ඔවුන් සොයාගෙන තිබෙන කර්තව්‍යයක මහිමය! අපගේ කඩාකප්පල් කාරයන් හොඳටම සෑහෙන තරමට ''මර්දනය කර'' ඇත. අපට අඩුව ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. අපට අඩුව ඇත්තේ, කුමණ කඩාකප්පල් කාරයන් වැඩට යෙදිය යුතුද, ඒ කුමණ තන්හිද යන්න හරිහැටි තක්සේරු කිරීමය. නිදසුනක් ලෙසට, දැන් අපගේ සේවයට බැඳෙමින් සිටින කඩා කප්පල් කාරයන් සියයක් දෙනෙකු පාලනය කිරීමේ හැකියාව එක බොල්-ෂෙවික් නායකයෙකුට හෝ පාලකයෙකුට ගෙන දෙන පරිදි අපගේම බලවේගයන් සංවිධානය කිරීමය. පවතින තත්වය එසේ වූ කල. ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'', ''අන්ත පරා-ජයට පත්කර'' සහ ''සම්පූර්ණයෙන්ම වර්ධනය කිරීමට'' යන වදන් කියා පෑම යනු හුදෙක්ම ඉලක්කය වරද්ද ගැනීමකි. අන්ත පරාජයට පත් කිරීම, මර්දනය කිරීම ආදිය සමාජවාදය ගෙන ඒම සඳහා ප්‍රමාණවත් නොවන බව වටහා ගැනීමේ නොහැකියාව සුළු ධනපති පංතික විප්ලව-වාදියාට ආවේණික ලක්ෂණයකි. ලොකු දේපල හිමියෙකුට විරුද්ධව සරොස්වූ සුළු දේපල හිමියෙකුට එය ප්‍රමාණවත් විය හැකිය. නමුත්, නිර්ධන පංති විප්ලවවාදියෙක් කිසිකලෙකත් එම වරදට නොවැටෙන්නේය.

අප උපුටා දැක්වූ වචන සිනහවක් මතු කිරීමට හේතු වී නම්. ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ පහත සඳහන් සොයා ගැනීම නිසා මතුවනු ඇත්තේ කොක් හඬ ලැමකි. ඔවුන්ගේ මතය අනුව ''දකුණට නැඹුරු

වූ බොල්ෂෙවික් අපගමනය'' යටතේ සෝවියට් සමූහාණ්ඩුව ''රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට'' පරිනාම වීමේ තර්ජනය මතුවී තිබේ. මේපාර නම් ඔවුන් අපව හොඳටම බිය ගන්වා ඇත!'' ''වාම කොමියුනිස්ට්වාදීන්, ඔවුන්ගේ ප්‍රවාදවලින් සහ ලිපිවලින් මෙම තර්ජනාත්මක හෙළිදරව්ව යළිත් ප්‍රතිරාවය දෙවන්නේ මොන තරම් ජවයක් සහිතවද?

අපගේ සෝවියට් සමූහාණ්ඩුවේ දැන් පවතින තත්වය හා සමග සසඳන කල රාජ්‍ය ධනපති ක්‍රමය ඉදිරි පියවරක් වනු ඇති බව ඔවුන්ට කල්පනා වී නැත. සය මසක් පමණ කාලයකින් අපගේ සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය ස්ථාපිත වේ නම් එය විශාල ජයග්‍රහණයක් වනු ඇත. එවිට, අවුරුද්දක් ඇතුලත සමාජවාදය තදින් මුල් අල්ලන බවට හා එය අප රටේ අනභිභවනියත්වයට පත්වන බවට එම රාජ්‍ය ධනපති ක්‍රමය සහතිකයක් වනු ඇත.

''වාම කොමියුනිස්ට්වාදියා'' මෙම වචන වලින් ඉවතට හැරෙනු ඇත්තේ මොන තරම් උත්තම උදහසකින්ද යනුත්, ''දකුණට යොමු වූ බොල්ෂෙවික් අපගමනයට'' විරුද්ධව ඔහු කම්කරුවන් අමතා කරනු ඇත්තේ මොන තරම් නිෂේධකාරී විවේචනයක් ද යනුත්, මට සිතා ගත හැකිය. හැබැට ම? සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය දිසාව බලා කෙරෙන පරිවර්තනය ඉදිරි පියවරක් වනු ඇත? ... මෙය සමාජවාදයට ද්‍රෝහි වීමක් නොවේද?

මෙහිදී, අපි ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ ආර්ථික දෝෂයේ මුල වෙත එළඹෙන්නෙමු. මෙම කරුණ ගැන වඩාත් විස්තර සහිතව විමසිය යුත්තේ එහෙයිනි.

ප්‍රථමයෙන්ම, අප රට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව යනුවෙන් හැඳින් වීමට අපට අයිතියක් ලැබෙන්නේ සහ හේතු සාධක වන්නේ ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා සිදුවන කුමණ පරිවර්තනයක් නිසාද යනු ''වාම කොමියුනිස්ට්වාදීන්ට'' වැටහෙන්නේ නැත.

දෙවැනිව, අප රටේ සමාජවාදයට ප්‍රධාන සතුරා වන්නේ සුළු ධනපති ගති ලක්ෂණය බව නොපිළි ගැනීම නිසාම ඔවුහු ඔවුන්ගේ සුළු ධනපති චිත්ත ස්වභාවය හෙළිදරව් කරති.

තුන්වැනිව, සෝවියට් රාජ්‍යය ආර්ථික වශයෙන් ධනපති රාජ්‍යයට වඩා වෙනස් බව වටහා ගැනීමට ඔවුන්ගේ ඇති අසමර්ථතාවය ''රාජ්‍ය ධනපති ක්‍රමය'' ගැන ඔවුන් දක්වන බලවත් බිය අනුව හෙළිදරව්වේ.

අපි මෙම කරුණු තුන පරික්ෂා කර බලමු.

රුසියාවේ ආර්ථික ක්‍රමය ගැන අධ්‍යයනය කිරීමේදී එහි පරිවර්තනීය ස්වභාවය නොපිළිගෙන ප්‍රතික්ෂේප කළ කෙනෙක් නැතැයි මම අදහස් කරමි. එසේම සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව යන පාඨයෙන් අදහස්

වන්නේ සමාජවාදය කරා පරිවර්තනය වීමට සෝවියට් බලයේ ඇති අධිෂ්ඨානය මිස පවතින නව ආර්ථික ක්‍රමය සමාජවාදය ලෙස පිළිගැනීමක් නොවන බව කිසිම කොමියුනිස්ට්වාදියෙක් ප්‍රතික්ෂේප කර නැතැයි ද සිතමි.

නමුත් මෙම ''පරිවර්තනය'' යන වචනයේ අර්ථය කුමක් ද? ආර්ථිකයට ගලපන ලද කල මෙයින් අදහස් කෙරෙන්නේ ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකෙහිම ගති ලක්ෂණ, අංශු හෝ කැබලි වර්තමාන ක්‍රමයෙහි තිබෙන බවක් ද? ඒ එසේය යන්න ගැන කවුරුත් එකඟ වනු ඇත. නමුත්, වර්තමාන අවස්ථාවේ රුසියාවේ පවතින විවිධ සමාජ-ආර්ථික ව්‍යුහයන් ඇත්ත වශයෙන් ම සමන්විතවන්නේ කුමණ මූලිකාංග-යන්ගෙන්ද යන්න ගැන සලකා බැලීමට තරම් කරදර වන්නේ ඉහත කරුණ පිළිගන්නා සෑම කෙනෙක්ම නොවේ.

අපි මෙම මූලිකාංගයන් නම් කරන්නෙමු:

1) පිතෘ මූලික, එනම්, බොහෝ දුරට, ස්වාභාවික ගොවිජන ගොවි තැන;

2) කුඩා පරිමාණ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය (තමන්ගේ ධාන්‍ය විකුණන ගොවි ජනයා බොහෝ දෙනෙක් මෙයට ඇතුලත්ය);

3) පෞද්ගලික ධනපති ක්‍රමය;

4) රාජ්‍ය ධනපති ක්‍රමය;

5) සමාජවාදය.

රුසියාව කොතරම් විශාලද හා විවිධ ද යත්, මෙම නොයෙක් වර්ගයේ සමාජ ආර්ථික ව්‍යුහයන් සියල්ලම එකට පැටලී පවතී. වර්තමාන තත්වයේ විශේෂ අංගලක්ෂණය සැදෙන්නේ එයිනි.

මෙම ප්‍රශ්නය පැන නගින්නේය: ප්‍රබලවන්නේ කුමණ මූලිකාංගයන් ද? කුඩා ගොවිජන රටක, ඉඩම් ගොවිතැන් කරන අතිබහුතරයක් ජනකාය සුළු වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන් වන නිසා, සුළු ධනපති මූලිකාංගය ප්‍රබල වන්නේය, එය ප්‍රබල විය යුතුය. අපගේ රාජ්‍ය ධනපති ක්‍රමයේ (ධාන්‍ය ඒකාධිකාරය, රජයෙන් පාලනය කෙරෙන ව්‍යවසායිකයන් හා වෙළෙන්දන්, ධනපති සමූපකාරකයන්) කවුව වරෙක එක තැනකින් සහ තවත් වරෙක තවත් තැනකින් ලාභ ගරන්නන් විසින් සිදුරු කරනු ලැබේ. ලාභ ගැරීමේ ප්‍රධාන භාණ්ඩය වී තිබෙන්නේ ධාන්‍ය ය.

ප්‍රධාන අරගලය කරනු ලබන්නේ මෙම ක්ෂේත්‍රයෙහිය. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' වැනි ආර්ථික ප්‍රවර්ගයන් ගැන කථා කරන්නෙමු නම් මෙම අරගලය සිදුවන්නේ කුමණ මූලිකාංගයන් අතර ද? එම අරගලය සිදුවන්නේ මා ඒවා නම් කර ඇති පිළිවෙළ අනුව හතරවැනි සහ පස්වැනි මූලිකාංගයන් අතරද? ඇත්තෙන්ම නැත. සමාජවාදයට විරුද්ධව යුද්ධ

ප්‍රකාශ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමය නොවේ. එසේ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමයටත්, සමාජවාදයටත් යන දෙකටම විරුද්ධව එක්ව සටන් කරන සුළු ධනපති සහ පුද්ගලික ධනපති ක්‍රමය ය. රාජ්‍ය ධනපති ක්‍රමයේ මෙන්ම, රාජ්‍ය සමාජවාදී ක්‍රමයේ මෙන්ම, සෑම වර්ගයකම රාජ්‍ය ඇඹිලි ගැසීමකට, ගිණුම් තැබීමකට හා පාලනයකට සුළු ධනපති පංතිය විරුද්ධ වන්නේය. මෙය කිසිසේත් නැතැයි කිව නොහැකි යථාර්ථ කරුණකි. "වාම කොමියුනිස්ට්වාදීන්ගේ" ආර්ථික දෝෂයට මූල, ඔවුන් මෙය වටහා නොගැනීමය. අපගේ ප්‍රධාන "අභ්‍යන්තර" සතුරන් වන්නේ, සෝවියට් බලයේ ආර්ථික පියවරයන්ගේ සතුරන් වන්නේ ලාභ ගරන්නා, වාණිජ ව්‍යාපාරයා සහ ඒකාධිකාරය කඩා කප්පල් කරන්නා යන මොවුන්ය. "නෝරාගත්" කිප දෙනෙකු මරා දැමීමෙන් සහ ගිගුරුම් හඬ දෙමින් කළ වතුර කථා මගින් ලාභ ගරන්නා මර්දනය කිරීමට එක සිය විසිපස් වසරකට පෙර ප්‍රයත්න දැරූ ඉතාමත් භක්තිමත් සහ අවංක විප්ලවවාදීන් වූ ප්‍රංශ සුළු ධනපතියන්ට සමාව දිය හැකි වන්නට තිබුණි. එසේ වුවත්, අද, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සමහර වාම සමාජවාදී-විප්ලවවාදීන් දක්වන වතුර කථා පැවැත්වීමේ ආකල්පය නිසා, දේශපාලන විඥනය ඇති සෑම විප්ලවවාදියෙක්ම තුළ පැන නගිනු ඇත්තේ අප්‍රසාදය හා පිළිකුළ මිස අන් කිසිවක් නොවේ. ලාභ ගැරීමේ අර්ථික පදනම වන්නේ රුසියාවේ සෑම තන්හිම බහුල වශයෙන් පැතිරී සිටින සුළු දේපල හිමියන් සහ සෑම සුළු ධනපතියෙක්ම ඒජන්තවරයෙක් කොටගත් පුද්ගලික ධනපති ක්‍රමය යන දෙකොටසම බව අපි ඉතා හොඳින් දනිමු. මෙම සුළු ධනපති බූවල්ලා උගේ දශලක්ෂ සංඛ්‍යාත අඬුවලින් වරින් වර කම්කරු කොටස් වට කර ගනු ලබන බවත්, රාජ්‍ය ඒකාධිකාරය වෙනුවට, ලාභ ගැරීම අපගේ සමාජ හා ආර්ථික ජීවේන්ද්‍රියෙහි සෑම සිදුරක්ම තුළට කාවදින බවත් අපි දන්නෙමු.

මෙය නොදක්නාවුන් සුළු ධනපති පූර්ව මතයේ වහලුන් වී සිටින බව ඔවුන්ගේ මෙම අන්ධ කමෙන් පෙනේ. අපගේ "වාම කොමියුනිස්ට්වරු" ද වැටී සිටින්නේ මෙම තත්වයටමය. ඔවුන් වචනයෙන් (හා ගැඹුරුතම විශ්වාසය අනුව) සුළු ධනපති පංතියේ නිරනුකම්පික සතුරන් වන අතර ක්‍රියාවෙන් සුළු ධනපතියන්ට ම පමණක් ආධාර කරති. එසේම ජනගහනයේ මෙම කොටසට පමණක් සේවය කරති. 1918 අප්‍රේල් මාසයේදී!! "රාජ්‍ය ධනපති" ක්‍රමයට විරුද්ව සටන් කිරීමෙන්ද ඔවුන් ප්‍රකාශ කරන්නේ එම ජනකොටසේම අදහස පමණකි. ඔවුහු ඉලක්කය අසලකට වත් ළං නොවෙති!

යුද්ධ කාලය තුළදී "අවංක" හා විශේෂයෙන්ම වංක මාර්ගයෙන් සුළු ධනපතියෝ දෙතුන් දහසින් මුදලක් ඉතිරි කරගෙන සිටිති. ඔවුහු ලාභ

ගරන සහ පෞද්ගලික ධනපති ක්‍රමයේ පදනම වශයෙන් ප්‍රයෝජනවත් වන ආර්ථික ප්‍රවර්ගයේ ලක්ෂණ ඇති පිරිසක් වෙති. මුදල යනු එය හිමියාට සමාජ වස්තුව ලබා ගැනීමට අයිතිය දෙන සහතිකයකි. කෝටි සංඛ්‍යාත සුළුදේපල හිමියෝ මෙම සහතිකය කෙරෙහි එල්බ ගෙන එය "රාජ්‍යයෙන්" වසං කරති. සමාජවාදය හෝ කොමියුනිස්ට් ක්‍රමය ගැන විශ්වාසයක් නොතබන ඔවුහු නිර්ධන පංති කුණාටුව හමායන තෙක් කල් බලති. එක්කෝ අපි සුළු ධනපතියන් අපගේ ගිණුම් තැබීමට සහ පාලනයට යටත් කළ යුත්තෙමු (දේශපාලන විඥානය ඇති නිර්ධන පංතිය වටා ජනගහනයෙන් බහුතරය, නැතහොත් අර්ධ නිර්ධන පංතිකයන් සංවිධානය කරන්නෙමු නම්, අපට මෙය කළ හැකිය). එසේ නැතහොත්, මෙම සුළු දේපල හිමිකම නැමැති භූමියෙහිම පැනනැගුනු නැපෝලියන්ලා සහ කැවිග්නැක්ලා විසින් විප්ලවය පෙරළා දමන ලද මෙන්ම, ස්ථිරවම සහ අනිවාරණීය වශයෙන්ම, සුළු ධනපතියන් අපගේ කම්කරු බලය පෙරළා දමනු ඇත. ප්‍රශ්නය හා සම්බන්ධයෙන් දැන් පවතින තත්වය එසේය. මෙම සරල සහ පැහැදිලි සත්‍යය නොපෙනෙන්නේ වාම සමාජවාදී-විප්ලවවාදීන්ට පමණකි. "වෙහෙසෙන" ගොවි ජනයා ගැන ඔවුන් දොඩන හිස් වදන් පිළිබඳ මීහිඳුම නිසා ඔවුන්ට එම සත්‍යය නොපෙනේ. නමුත් මෙම වාම සමාජවාදී-විප්ලවවාදීන් ගැන බරපතල ලෙස ගණන් ගන්නෝ කවරහුද?

තමන්ගේ දහස් ගණනක මුදල රැස්කර තබා ගන්නා සුළු ධනපතියා රාජ්‍ය ධනපති ක්‍රමයේ සතුරෙකි. ඔහුට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ම සඳහා, දුප්පතුන්ට විරුද්ධව, මොනම වර්ගයක හෝ රාජ්‍ය පාලනයට විරුද්ධව තමන්ගේ දහස් ගණනක මුදල යෙදීමටය. එසේම මෙම දහස් ගණන්වල මුළු එකතුවෙන් සැදෙන කෝටි සිය ගණනක මුදල අපගේ සමාජවාදය ගොඩ නැගීමේ කටයුතු දුර්වල කරන ලාභ ගැරීමේ පදනම වන්නේය. කිසියම් කම්කරුවන් සංඛ්‍යාවක්, දින කීපයක් තුළදී 1000 ක වටිනාකම් නිපදවතියි සිතමු. සුළු ලාභ ගැනීම සහ විවිධාකාර වංචා නිසා ද, සුළු දේපල හිමියන් සෝවියට් ආඥා සහ රෙගුලාසි මග හැරීම නිසාද, මෙම 1000 න් 200 ක් අතුරුදහන් වෙතැයි ද සිතමු. 1000 න් 300 ක් වැය කර වඩාත් හොඳ සංවිධානයක් ඇති කර ගත හැකි නම්, 200 වෙනුවට තමන් කැමැත්තෙන්ම 300 ක් දෙන බව දේශපාලන විඥානය ඇති සෑම කම්කරුවෙක්ම කියනු ඇත. මක් නිසාද යත්, පසුව, ක්‍රමානුකූලතාවය සහ සංවිධානය තහවුරු කළ පසු, සුළු ධනපතියන් විසින් රාජ්‍ය ඒකාධිකාරය කඩාකප්පල් කරනු ලැබීම පරාජය කළ පසු, මෙම "කප්පම" 100 ක් හෝ 50 ක් දක්වා අඩු කිරීම අපහසු නොවන හෙයිනි.

සම්පූර්ණ පැහැදිලිතාවය තකා, මා උවමනාවෙන්ම අන්තය දක්වා සරල කළ මෙම සංඛ්‍යාමය නිදර්ශනයෙන් රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය අතර වර්තමාන සහසම්බන්ධය පැහැදිලි වේ. කම්කරුවන්ට රාජ්‍ය බලය හිමිව තිබෙන නිසා සමාජවාදී අරමුණු සඳහා හැර වෙනත් කිසිවක් සඳහා කොපෙක් එකක් හෝ නොදී මුළු දහසම ගැනීමේ සෑම නීතිමය අවස්ථාවක්ම ඔවුනට ඇත. ඇත්ත වශයෙන්ම බලය කම්කරුවන් අතට පත්වීම මත රැඳී පවතින මෙම නීතිමය අවකාශය සමාජවාදයේ මූලිකාංගයකි.

නමුත්, සුළු දේපල හිමි සහ පෞද්ගලික ධනපති ගති ලක්ෂණය නොයෙක් ආකාරයෙන් මෙම නීතිමය අවකාශය දුර්වල කරයි; ලාභ ගැරීම වැද්ද ගනියි; සෝවියට් ආඥවන් ක්‍රියාත්මක කිරීමට බාධා කරයි. එනිසා අප දැන් ගෙවනවාට වැඩිය ගෙව්වත්, රාජ්‍ය ධනපති ක්‍රමය යෝධ ඉදිරි පියවරක් වනු ඇත. (මා සංඛ්‍යාමය නිදසුනක් ගත්තේ කරුණ තොළින් පැහැදිලි කරනු පිණිසය). එසේ කියන්නේ, ''අධ්‍යාපනය'' ලැබීම කම්කරුවන්ට ප්‍රයෝජනවත් නිසා ඒ සඳහා ගාස්තු ගෙවීම පාඩුවක් නොවන හෙයිනි; අපිළිවෙළ, ආර්ථික විනාශය සහ නොසැලකිල්ල පරදවා ලබන ජයග්‍රහණය ඉතාමත් වැදගත් දෙය වන හෙයිනි; රාජ්‍ය ධනපති ක්‍රමයට වඩාත් බරපතල කප්පමක් ගෙවූවත් එයින් අප විනාශයට පත් නොවන හා ඉතාමත් විශ්වාසදයක මාර්ගය ඔස්සේ අපට සමාජවාදය කරා යාමට හැකි වන අතර, සුළු දේපලහිමි ක්‍රමයේ අරාජිකත්වය තවදුරටත් පැවැතීම ඉතාමත් විශාල හා බරපතල අන්තරායක් හා (එය පරාජය නොකළ හොත්) අපගේ ඒකාන්ත විනාශයද වන හෙයිනි. සුළු දේපල හිමි කමේ අරාජිකත්වයට විරුද්ධව රාජ්‍ය යන්ත්‍රය ආරක්ෂා කරන හැටි කම්කරු පංතිය උගෙන ගත් පසු, ජාතික පරිමාණයෙන් හා රාජ්‍ය ධනපති ක්‍රියාමාර්ග අනුව මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමට එය උගෙන ගත් පසු එයට — මෙම වචනය යෙදීම මනා නම් — තුරුම්පු සියල්ලම අත් වීමත්, සමාජවාදය තහවුරුවීමත් සහතික වනු ඇත.

ප්‍රථම කොටම, රාජ්‍ය ධනපති ක්‍රමය ආර්ථික වශයෙන් දැන් පවතින අපගේ ආර්ථික ක්‍රමයට වඩා අපරිමිත තරමින් උසස්ය.

දෙවැනිව, සෝවියට් රාජ්‍යය යනු කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ බලය සහතික වූ රාජ්‍යයක් වන හෙයින්, සෝවියට් බලයට එයින් වන භයානක අන්තරායක්ද නැත. මෙම අවිවාදී සත්‍යයන් වටහා ගැනීමට ''වාම කොමියුනිස්ටවාදීහු'' අසමත් වූහ. සාමාන්‍ය වශයෙන්ම දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ අදහස් තම හිස තුළ ඒකාබද්ධ කර ගත නොහැකි ''වාම සමාජවාදී-විප්ලවවාදීන්ට'' මෙම සත්‍යයන් කිසි කලෙකත් වටහා ගත නොහැකි වනු ඇත. නමුත් සෑම මාක්ස්වාදියෙක්ම ඒවා පිළිගත

යුත්තේය. වාම සමාජවාදී-විප්ලවවාදියෙක් සමග තර්ක කිරීම වුවද වැදගත් නොවන්නේ ය, හුළං මල්ලක් පිළිබඳ ''පිළිකුල් සහගත නිදර්ශනයක්'' දෙසට ඔහු ඇඟිල්ල දික්කර පෙන්නුම් කිරීම ප්‍රමාණවත්ය. නමුත් ''වාම කොමියුනිස්ට්වාදීන්'' සමග තර්ක කළ යුතුය. ඒ එහිදී වරද කරන්නේ මාක්ස්වාදීන් වන නිසා සහ ඔවුන්ගේ වරද විග්‍රහ කිරීම කම්කරු පංතියේ නියම මග සොයා ගැනීමට එයට ආධාරයක් වන නිසාය.

## IV

කරුණු තවත් පැහැදිලි කිරීම සඳහා, රාජ්‍ය ධනපති ක්‍රමය පිළිබඳ ඉතාමත් යථාර්ථ නිදර්ශනය ගෙන බලමු. එම නිදර්ශනය කුමක්දැයි කවුරුත් දනිති. එය ජර්මනිය වේ. නවීන මහා පරිමාණ ධනපති ඉන්ජිනේරු කර්මාන්ත හා සැලැස්මානුකූල සංවිධානය ''තවත් කියන්නට දෙයක් නැති'' තත්වයට වර්ධනය වී ඇත්තේ එරටෙහි ජුන්කර්-ධනපති අධිරාජ්‍යවාදය යටතේ ය. මෙහි යටින් ඉරි ඇඳි වචන ඉවත් කර, යුද්ධවාදී, ජුන්කර්[5], ධනපති, අධිරාජ්‍යවාදී රාජ්‍යය වෙනුවට වෙනත් රාජ්‍යයක්, එහෙත්, වෙනත් වෙනස් සමාජමය වර්ගයක, වෙනත් පංති සන්ධාරයක් ඇති රාජ්‍යයක්, එනම්, සෝවියට් රාජ්‍යයක්, නිර්ධන පංති රාජ්‍යයක්, යන්න යොදන්න. සමාජවාදය සඳහා අවශ්‍ය කොන්දේසිවල එකතු සම්පූර්ණය එවිට එහි අන්තර්ගත වනු ඇත.

නවීන විද්‍යාවේ අළුත්ම සොයා ගැනීම් පදනම් කරගත් මහා පරිමාණ ධනපති ඉන්ජිනේරු කර්මාන්ත නොමැතිව සමාජවාදය ගැන සිතන්නට නොහැකිය. නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ අනුමත සම්මතයන් තරයේ අනුගමනය කරන තත්වයෙන් කෝටි ගණන් ජනයා යොමු කර ගන්නා සැලසුම් කළ රාජ්‍ය සංවිධානයක් නොමැතිව එය ඇතිවීම ගැන සිතන්නටවද නොපුළුවන. මාක්ස්වාදීන් වන අපි නිතරම මේ ගැන කථා කෙළෙමු. නමුත් මෙය පවා නොවැටහෙන (අරාජිකවාදීන් සහ වාම සමාජවාදී විප්ලවවාදීන්ගෙන් අඩක් පමණම) අය සමග කථා කිරීමට තත්පර දෙකක්වත් මිඩංගු කිරීමේ ප්‍රයෝජනයක් නොමැත.

ඒ අතරම, නිර්ධන පංතිය රාජ්‍යයේ පාලකයා නොවන්නේ නම්, එම තත්වය යටතේද සමාජවාදය ගැන සිතන්නට නොපුළුවන. මෙය අ යන්න ආ යන්න මෙන් පැහැදිලි කරුණකි. තවද ඉතිහාසය කොතරම් අමුතු මාවතක් ගෙන ඇත්තේද යත්, (ඉතිහාසය සන්සුන් ලෙස, මෘදු ලෙස, පහසුවෙන් හා සරල ලෙස සම්පූර්ණ සමාජවාදය ගෙන එනු ඇතැයි යනු, පළමු පෙළේ මෙන්ෂෙවික් මොට්ටයන් හැර අන් කිසිවෙක් කිසි කලෙකත් අපේක්ෂා නොකෙළේය) එය, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ

කටුව තුළ වන අනාගත කුකුළු පැටවුන් දෙදෙනෙකු හා සමාන වන ලෙසට එකිනෙකට අසම්බන්ධව එක පෙළට පවතින සේ සමාජවාදය කොටස් දෙකකින් යුක්තව 1918 දී බිහි කළේය. එක් අතකින් සමාජවාදය සඳහා අවශ්‍ය ආර්ථික, නිෂ්පාදනීය සහ සමාජ-ආර්ථික කොන්දේසිද, අනිත් අතින් ඒ සඳහා අවශ්‍ය දේපාලන කොන්දේසිද ද්‍රව්‍යමය වශයෙන් ඉටුවීම පිළිබඳව 1918 දී පවතින ඉතාමත් සිත් ගන්නා ප්‍රතිමූර්තිය වී තිබෙන්නේ, ජර්මනිය සහ රුසියාව ය.

ජර්මනියේ සාර්ථක නිර්ධන පංති විප්ලවයක් ඇති වුව හොත් වහාම හා ඉතා පහසුවෙන්ම අධිරාජ්‍යවාදයේ කටුව පොඩි කෙරෙනු ඇත (අවාසනාවකට මෙන් එය ඉස්තරම්ම වානේවලින් සද ඇති හෙයින් ඕනෑම... කුකුළු පැටවෙකුට බිඳිය හැකි නොවේ). එවිට නියත වශයෙන්ම, කිසි අමාරුවක් නොමැතිවම, නැතහොත්, ඉතා සුළු අමාරුවකින් ලෝක සමාජවාදයේ ජයග්‍රහණය සිදු කෙරෙනු ඇත. නමුත් මෙහිදී අප ''අමාරුව'' යනුවෙන් අදහස් කරන්නේ පටු අමන අර්ථයෙන් නොව, ලෝක ඓතිහාසික පරිමාණයේ ''දුෂ්කරතාවයන්'' වේ.

ජර්මනියේ විප්ලවය ''එළි දැකීම'' තවමත් ප්‍රමාද වන අතර, අපගේ කර්තව්‍යය වන්නේ ජර්මන් වරුන්ගේ රාජ්‍ය ධනපති ක්‍රමය අධ්‍යනය කිරීම, එය පිටපත් කර ගැනීමට හැකි සෑම වෙහෙසක්ම දැරීම සහ එම පිටපත් කිරීම කඩිනම් කරනු සඳහා ආඥාදායක ක්‍රම යොද ගැනීමට පැලි නොවීම ය. අපගේ කර්තව්‍යය නම් මෙම පිටපත් කර ගැනීම ඉක්මන් කිරීමය. අසංස්කෘත රුසියාව විසින් බටහිර සංස්කෘතිය පිටපත් කරගනු දැකීමට පීටර් රජු ඉක්මන් වූවාටත් වැඩියෙන් අපි මෙහිදී කඩිනම් විය යුත්තෙමු. අසංස්කෘත ස්වභාවයට විරුද්ධව සටන් කිරීමට අසංස්කෘත ක්‍රම යොද ගැනීමේදී අපි පසුබට නොවිය යුත්තෙමු. නර්ටිසිස් ස්වභාවයේ සංකල්පනාවලින් සතුටුවන සහ ජර්මන් අධිරාජ්‍යවාදයෙන් ''පාඩම් උගෙන ගැනීම'' විප්ලවවාදීන් වන අපට තරම් නොවන බව කියන (මෙම මොහොතේ මට මතක් වන්නේ මධ්‍ය විධායක කාරක සභා රැස්වීමේදී කරේලින් සහ ගේ කළ කථාවන්ය) අරාජිකවාදීන් සහ සමාජවාදී-විප්ලවවාදීන් සිටිත් නම්, ඔවුනට පිළිතුරු වශයෙන් අපට කිව හැක්කේ මෙය පමණකි; මේ මිනිසුන් ගැන බරපතල ලෙස ගණන් ගන්නා විප්ලවයක් නොවැළැක්විය හැකි සේ (සහ යුක්ති යුක්ත ලෙස) වැනසී යනු ඇත.

දැනට සුළු ධනපති ක්‍රමය රුසියාවේ ප්‍රබලව පවත්නේය. එහි සිට රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකටම යායුත්තේ එකම මාර්ගයෙනි. එම මාවත වැටී ඇත්තේ ''නිෂ්පාදනය සහ බෙද හැරීම පිළිබඳ ජාතික ගිණුම් තැබීම සහ පාලනය'' යනුවෙන් හැඳින්වෙන අතරමැද ඇති එකම නැවතුම්පල හරහාය. මෙය වටහා ගැනීමට අසමත් වන අය

ආර්ථික ක්ෂේත්‍රයෙහි දී කරන්නේ සමාව දිය නොහැකි වරදකි. එක්කෝ ඔවුහු ජීවිතයේ සත්‍ය කරුණු නොදනිති; යථාර්ථ වශයෙන් පවතින දේ නොදකිති; එනිසා, එක එල්ලේම සත්‍ය දෙස බැලීමට අසමත් වෙති. නැතහොත්, ඔවුහු ''ධනපති ක්‍රමය'' සහ ''සමාජවාදය'' වියුක්ත ලෙස සංසන්දනය කිරීමෙහි යෙදෙති; එහිදී, අප රටේ සිදුවෙමින් පවතින පරිවර්තනයේ නියත ආකෘති සහ අවධි ගැන අධ්‍යයනය කිරීමට අසමත් වෙති. ''නොවයා ෂිස්න්'' සහ ''විපිරියොද්'' කඳවුරේ හොඳම අය නොමඟ යාමට හේතු වූයේ ඉඳුරාම මෙම න්‍යායික වරද නිසාම බව අමතර වශයෙන් කිව යුතුය. එම කඳවුරේ නරකම සහ සාමාන්‍ය අය ධනපති පංතිය කෙරෙහි භය පක්ෂ ගතියක් දක්වමින් එය පස්සේ ඇදෙති. එයට හේතුව ඔවුන්ගේ මෝඩ ගතිය හා කොන්ද පණ නැති කම වන්නේය. මාක්ස්වාදයේ ගුරුවරු, ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ මුළු කාල පරිච්ඡේදයක් ගැන කියමින් නව සමාජයේ ''දීර්ඝ කාලයක් පවතින ප්‍රසව වේදනා'' ගැන අවධාරණය කළේ හේතුවක් නොමැතිව නොවන බව ඔවුන් අතර සිටින හොඳම අය පවා වටහා නොගත්හ. තවද, මෙම නව සමාජයද වියුක්ත සංකල්පයක් විය. එය ජනිත වූයේ එක් හෝ තවත් සමාජවාදී රාජ්‍යයක් නිර්මාණය කිරීමට දරන ලද විවිධාකාර, අඩු පාඩු සහිත නියත ප්‍රයත්නයන් මාලාවක් මඟින් යාමෙන් පමණකි.

''රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට පරිනාම වීම'' (''කොමියුනිස්ට් අංක 1, පිටු 8, තීරුව 1) ගැන කීමෙන් අනුන් රවටීමට සහ තමන්ම රවටා ගැනීමට දරන ප්‍රයත්නය අන්ත න්‍යායික විකාරයක් වනුයේ, ධනපති ක්‍රමයට සහ සමාජවාදයට පොදු භූමිය (වන ජාතික ගිණුම් තැබීම සහ පාලනය) පසු නොකර, දැනට මෙහි පවතින ආර්ථික තත්වයේ සිට ඉදිරියට යාමට නොහැකි හෙයිනි. මෙයින් පෙනෙන්නේ යමෙක් තමන්ගේ සංකල්පනා නියම ''පරිනාමයේ'' මාවතෙන් බැහැර යාමට ඉඩ හරින සහ මෙම මාවත කුමක්ද යන්න වටහා ගැනීමට අසමත් වන බවය. එය ව්‍යවහාරික වශයෙන් ගත් කල, සුළු දේපල හිමි ධනපති ක්‍රමය වෙත ආපසු ඇදගෙන යාමකට සමාන වේ.

රාජ්‍ය ධනපති ක්‍රමය මවිසින් මෙසේ ''උසස්'' ලෙස අගය කරන ලද ප්‍රථම අවස්ථාව මෙය නොවන බවත්, බොල්ෂෙවික්වරු බලය අල්ලා ගැනීමට පෙර මා එසේ කළ බවත්, පාඨකයාට ඒත්තු ගැන්වීම පිණිස, ''ළඟ එන මහා විපත සහ එයට විරුද්ධව සටන් කරන හැටි'' යන, 1917 සැප්තැම්බරයේ ලියන ලද මගේ කුඩා පොතෙන් පහත සඳහන් කොටස උපුටා දක්වමි.

''... ජුන්කර්-ධනපති රාජ්‍යයක් වෙනුවට, ඉඩම් හිමි-ධනපති ක්‍රමය වෙනුවට, විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ආදේශ කිරීමට ඇත්

උත්සාහ ගන්න. එනම්, විප්ලවවාදී ක්‍රමයකින් සියළුම වරප්‍රසාද අහෝසි කරන සහ විප්ලවවාදී ක්‍රමයකින් සම්පූර්ණතම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට බිය නොවන රාජ්‍යයක් ආදේශ කිරීමට උත්සාහ ගන්න. නියම විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ඇතොත්, රාජ්‍ය ඒකාධි කාරී ධනපති ක්‍රමය යනුවෙන් අනිවාර්ණීය ලෙසට හා නොවැලැක් විය හැකි ලෙස අදහස් වන්නේ සමාජවාදය දෙසට යොමුවූ පියවරක් බව, පියවර එකකට වැඩි ගණනක් බව, ඔබට පෙනෙනු ඇත!

''... එසේ කියන්නේ සමාජවාදය යනු හුදෙක්ම රාජ්‍ය ධනපති ඒකාධි කාරයේ සිට ඊළඟ ඉදිරි පියවර වන හෙයිනි.

''... රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය යනු සමාජවාදය සඳහා අවශ්‍ය සම්පූර්ණ ද්‍රව්‍යමය සූදනම් කිරීම වන්නේය; එය සමාජවාදයට එළඹෙන එළිපත්ත, නැතහොත්, එයත් සමාජවාදය නැමති හිණි පෙත්තත් අතර අන්තර් හිණි නොමැති හිණි පෙත්ත වන්නේය'' (පිටු 27 හා 28).*

මෙය ලියන ලද්දේ කෙරෙන්ස්කි බලයේ සිටියදී බව සහ එහි අප සාකච්ඡා කරන්නේ නිර්ධන පංති ආඥාදායකත්වය ගැන නොව, සමාජවාදී රාජ්‍යය ගැන නොව, ''විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී'' රාජ්‍යය ගැන බව සටහන් කරගන්න. අප මෙම දේශපාලන හිණිමගෙහි වඩාත් ඉහළට නැග සිටි තරමට, සමාජවාදී රාජ්‍යය සහ නිර්ධන පංති ආඥාදායකත්වය සෝවියට් සභා තුළ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කළ තරමට ''රාජ්‍ය ධනපති ක්‍රමය ''ගැන අප අඩුවෙන් බිය විය යුතු බව පැහැදිලි නොවේද? ද්‍රව්‍යමය, ආර්ථික සහ නිෂ්පාදනීය දෘෂ්ටි කෝණය අනුව බලන කළ,අප තවමත් සමාජවාදයේ ''එළිපත්ත'' වෙත පැමිණ නැති බව පැහැදිලි නොවේද? අප තවමත් සම්ප්‍රාප්ත වී නොමැති ''එළිපත්ත'' පසු නොකර සමාජවාදයේ දෙරෙන් ඇතුළු විය නොහැකි බව නොපැහැදිලි ද?

අප කුමණ පැත්තෙන් ප්‍රශ්නයට සමීප වුවත්, බැස ගත හැක්කේ එකම නිගමනයකටය. ඒ මෙසේය: අපට තර්ජනයක් වී තිබෙ යයි කියනු ලබන ''රාජ්‍ය ධනපති ක්‍රමය'' පිළිබඳව ''වාම කොමියුනිස්ටවාදීන්'' ඉදිරිපත් කරන තර්කය ආර්ථික වශයෙන් කරන බරපතල වරදක් වන අතර, ඔවුන් සුළු ධනපති දෘෂ්ටියට සම්පූර්ණයෙන්ම වහල් වී සිටින බව එයින් මනාව ඔප්පු වේ.

## V

මෙහි පහත දැක්වෙන කරුණද අතිශයින්ම උපදේශාත්මකය.

අප මධ්‍යම විධායක කාරක සභාවේදී බුහාරින් සහෝදරයා සමග

තර්ක කළ විට ඔහු වෙනත් කරුණු ද සඳහන් කරමින් ප්‍රකාශ කළේ, විශේෂඥයන්ට ඉහළ වැටුප් ගෙවීම හා සම්බන්ධ ප්‍රශ්නය ගැන වූ කල, යම් යම් තත්වයන් යටතේ ''ඔවුන් බුරුත්තෙන් චන්දිගෙවා ගැළවීම''[6] (ධනපතීන් බුරුත්තෙන් එනම්, ඉඩම් පැක්ටරි, වැඩ පලවල් හා වෙනත් නිෂ්පාදන මාර්ග සියල්ලම ධනපතියන් ගෙන් මිළට ගැනීම) කම්කරු පංතියට වඩාත් අවස්ථාවෝචිත වන්නේ යයි කී මාක්ස්ගේ වචන මතක තබා ගෙන ''අපි'' (මෙයින් අදහස් කරන ලද්දේ ''වාම කොමියුනිස්ටවාදීන්'' බව පෙනේ) මෙම ක්‍රියා මාර්ගය ප්‍රතිපත්තියෙන් බැහැර වීමක් ලෙස නොසැලකූ හෙයින් ''අපි ලෙනින්ට වඩා නිවැරදි'' යනුයි.

ඉහත සඳහන් ඉතාමත් සිත් ගන්නා ප්‍රකාශයෙන් ප්‍රථමයෙන්ම පෙනෙන්නේ, බුහාරින් අන්‍ය වාම සමාජවාදී-විප්ලවවාදීන්ට සහ අරාජිකවාදීන්ට වඩා බෙහෙවින් උසස් තත්වයක සිටින බවත්, ඔහු ගැලවීගත නොහැකි ලෙසට කිසිසේත්ම වදන් හරඹය නැමති මඩේ එරී නොමැති බවත්, එහෙත්, ඊට ප්‍රතිකූල වශයෙන් ඔහු ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා වූ පරිවර්තනයේ, එම වේදනා සහගත සහ අමාරු පරිවර්තනයේ නියත දුෂ්කරතාවයන් ගැන සිතා බැලීමට ප්‍රයත්න දරන බවත් ය.

දෙවැනිව, මෙම ප්‍රකාශය නිසා බුහාරින් ගේ වරද වඩාත් හොඳින් ප්‍රකට වන්නේය.

අපි මාක්ස්ගේ අදහස ගැන සුපරීක්ෂා කාරී ලෙස විමසා බලමු.

මාක්ස් සඳහන් කරන්නේ පසු ගිය ශත වර්ෂයේ හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍යය ගැනය. එනම්, පූර්ව ඒකාධිකාර ධනපති සංවර්ධනයේ උච්ච අවස්ථාව ගැනය. එකල බ්‍රිතාන්‍යය අන් සෑම රටකටම වඩා යුද්ධවාදය සහ නිලධාරිවාදය අඩුවෙන් පෙනෙන්නට තිබුණු රට විය. එවිට එය, කම්කරුවන් ධනපතියන් ''චන්දිගෙවා ගැනීමේ'' අර්ථයෙන් සමාජවාදය ''සාමකාමී ලෙස'' ජයග්‍රහණයට පත් වීමේ වැඩිම හැකියාව ඇති රටක් විය. එනිසා, ඇතැම් කොන්දේසි යටතේ ධනපතියන් චන්දිගෙවා ගැනීමට කම්කරුවන් ඇත්තෙන්ම නොකැමති නොවනු ඇතැයි මාක්ස් කීවේය. තමන් හෝ සමාජවාදී විප්ලවයේ අනාගත නායකයන් හෝ විප්ලවය කිරීමට අනුගමනය කළ යුතු ආකාර, මාර්ග හා මාධ්‍ය ගැන නියමයක් මාක්ස් විසින් නොකරන ලදී. අළුත් ගැටළු අති විශාල ගණනක් මතු වන වගත්, විප්ලවය අතරවාරයේදී මුළු තත්වයම වෙනස් විය හැකි වගත්, තත්වය සහමුලින්ම සහ බොහෝ විට විප්ලවය සිදු වන විටම වෙනස් විය හැකි වගත් ඔහු මැනවින් දැන සිටියේය.

හොඳයි, සෝවියට් රුසියාව ගැන කිව හැක්කේ කුමක්ද? අඩ ශත වර්ෂයකට පෙර බ්‍රිතාන්‍යයේ සාමකාමී පරිවර්තනයකින් සමාජවාදයට සංක්‍රමණය වීම සිදුවූයේ නම්, එහි ඇති විය හැකි වූ තත්වයන්ට සමාන

සමහර කොන්දේසි මෙහි නිර්ධන පංතිය බලය අල්වා ගත් පසු හා සූරාකන්නන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය හා කඩාකප්පල් කිරීම් පරාජය කළ පසු වුවද පවතින බව පැහැදිලි නැතිද? එවකට බ්‍රිතාන්‍යයේ බලපැවැති පහත සඳහන් තත්වයන් නිසා එහි ධනපතියන් ස්ථිරවම කම්කරුවන්ට යටත් වන්නට ඉඩ තිබුණි: (1) ගොවි ජනතාවක් නොමැති වීම නිසා (හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍යයේ කෘෂිකාර්මික ශ්‍රම කරුවන් අතර සමාජවාදය ඉතාමත් සීඝ්‍ර ලෙස පැතිරී ඇතැයි යන බලා පොරොත්තුවක් විය) ජනගහනයේ අති විශාල කොටස කම්කරුවන් හා නිර්ධන පංතිකයන් විය. (2) නිර්ධන පංතිය විශිෂ්ඨ ලෙස වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටියහ (මේ සම්බන්ධයෙන් එවකට ලෝකයේ ප්‍රධාන තැන ගත් රට බ්‍රිතාන්‍යය විය). (3) දේශපාලන නිදහසේ සංවර්ධනයෙහි ශතවර්ෂාධික කාලයක පුහුණුවක් ලත් නිර්ධන පංතිය තුළ සංසන්දනීය වශයෙන් උසස් සංස්කෘතික මට්ටමක් පැවැත්තේය. (4) හොඳින් සංවිධානය වී සිටි බ්‍රිතාන්‍ය ධනපතියන් අතර බල පැවති, සම්මුති මගින් දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න බේරුම් කර ගැනීමේ පැරණි පුරුද්දක් විය. එවකට බ්‍රිතාන්‍යයේ ධනපතියෝ ලෝකයේ අන් සෑම රටකම ධනපතියන්ට වඩා හොඳින් සංවිධානය වී සිටි යහ.(දැන් මෙම උසස් කම ජර්මනියට මාරු වී තිබේ). බ්‍රිතාන්‍ය ධනපතියන් කම්කරුවන් විසින් සාමකාමී ලෙස යටත් කරනු ලැබිය හැකිය යන අදහස එවකට උත්ගත වීමට හේතු වූයේ මෙම කරුණුය.

අප රටේ වර්තමාන අවස්ථාවේදී බල පවත්වන මූලික වැදගත් කමකින් යුත් කරුණු සමහරක් නිසා (ඔක්තෝබරයේ ජයග්‍රහණය සහ ඔක්තෝබරයේ සිට පෙබරවාරි දක්වා ධනපතියන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය සහ කඩා කප්පල් ක්‍රියා මර්දනය කිරීම නිසා) මෙම යටත් වීම ඒකාන්ත දෙයක් වී ඇත. නමුත්, රුසියාවේ ජයග්‍රහණයට වැදගත් සාධකය වූයේ, කම්කරුවන්, නිර්ධන පංතිකයන් ජනගහනයෙන් අති බහුතර කොටස වීම නොව, ඔවුන් අතර පැවති උසස් සංවිධාන මට්ටම නොව, දුප්පත් ගොවීන්ගෙන් සහ ක්ෂණික විනාශයට පත් කොටස්වලින් නිර්ධන පංතියට ලැබුණු ආධාරය ය. අවසාන වශයෙන් අපට උසස් සංස්කෘතික මට්ටමක් හෝ සම්මුති ඇති කර ගැනීමේ පුරුද්දක් හෝ නොමැත. මෙම යථාභූත කොන්දේසි ගැන සුපරීක්ෂාකාරී ලෙස සැලකිලිමත් වන්නේ නම්, අපට එක් වරම ක්‍රම දෙකක් අනුගමනය කිරීමට හැකි බව හා සිදුවන බව පැහැදිලි වනු ඇත. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' හා කිසිම සම්බන්ධයක් පැවැත්වීම හෝ කුමණ ආකාරයක වුව සම්මුතියක් ගැන සැලකීම හෝ ප්‍රතික්ෂේප කරන සහ ලාභ ගැරීම, ගොවීන්ට අල්ලස් දීම ආදියෙහි යෙදෙමින් සෝවියට් සභා ගන්නා පියවරයන් දිගටටම කඩා

කප්පල් කරන අසංස්කෘතික ධනපතියන් නිර්දය ලෙස මර්දනය කිරීමට* අප එක් අතකින් කටයුතු කළ යුතුය. අනිත් අතින්, අපි සම්මුති ක්‍රමය උපයෝගි කර ගත යුත්තෙමු. නැතහොත්, ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' උකහ වන, එය ක්‍රියාත්මක කිරීමට සමත් වන සහ කෝටි ගණන් ජනතාවන්ට ඇත්ත වශයෙන්ම භාණ්ඩ සම්පාදනය කරන විශාලතම වර්ගවල ව්‍යවසායයන් සංවිධානය කිරීමේ බුද්ධිය හා පළපුරුද්ද ඇතියවුන් ලෙස නිර්ධන පංතියට ප්‍රයෝජනවත් වන සදචාරවත් ධනපතියන් මුදලට ගැනීමේ කටයුතු කළ යුත්තෙමු.

බුහාරින් බොහෝ පොතපත කියවූ මාක්ස්වාදී අර්ථශාස්ත්‍රඥයෙකි. එනිසා, ඉඳුරාම සමාජවාදය කරා පරිවර්තනය වීම පහසු වීම සඳහාම, මහා පරිමාණ නිෂ්පාදන සංවිධාන රැක ගැනීමේ වැදගත්කම ගැන මාක්ස් කම්කරුවන්ට උගැන්වූ කරුණු ඉතාමත් නිවැරදි බව ඔහුට මතක් විය. ධනපතියන්ට ගෙවීම් කළහොත්, සාමකාමීව යටත් වන ලෙසටත්, සදචාරවත් හා සංවිධානාත්මක ලෙස සමාජවාදය පැත්තට ඒමටත් ඔවුන්ට බල කරන තත්වයක් පවතින්නේ නම්, ඔවුන්ට හරිහැටි ගෙවීම් කර ඔවුන් මිළට ගැනීම ගැන (විශේෂයක් වශයෙන් — එම විශේෂය බ්‍රිතාන්‍යය විය) සිතිය හැකි බව මාක්ස් උගැන් විය.

නමුත් බුහාරින් රුසියාවේ පවතින වර්තමාන විශේෂ අංග ලක්ෂණ ගැන ගැඹුරට සිතා නොබැලූ නිසා ඔහු නොමග ගියේය. එනම්, අපගේ දේශපාලන ක්‍රමය අතින් ද, කම්කරුවන්ගේ දේශපාලන බලය අතින් ද අප, නැතහොත් රුසියානු නිර්ධන පංතිය, ඕනෑම බ්‍රිතාන්‍යකට හෝ ඕනෑම ජර්මනියකට හෝ වඩා ඉදිරියෙන් සිටින විට, එහෙත්, රාජ්‍ය ධනපති ක්‍රමය හොඳින් සංවිධාන කිරීම අතින් ද අපගේ සංස්කෘතික මට්ටම අතින් ද, සමාජවාදය ''ආරම්භ කිරීමට'' ඇති සූදනම අතින්ද අප ඉතාමත්

* මෙහිදී අපි එක එල්ලේම සත්‍යය පිළිගත යුත්තෙමු. සමාජවාදයේ සාර්ථකත්වය සඳහා නැතිවම බැරි ඒ නිර්දය භාවය අප වෙත ඇත්තේ ඉතා අල්ප වශයෙනි. එය අල්ප වූයේ අපට අධිෂ්ඨානය මදකම නිසා නොවේ. අපට අධිෂ්ඨානය ප්‍රමාණවත් තරම් ඇත. අපට අඩුව තිබෙන්නේ ලාභ ගරන්නන්, වංචා කාරයින් සහ ධනපතියන්, එනම් සෝවියට් සභා අනුමත කළ පියවරයන් උල්ලංඝනය කරන්නන්, සැඟෙන සංඛ්‍යාවක්, අවශ්‍ය තරම් ඉක්මණින් අල්වා ගැනීමේ හැකියාව ය. මෙය කිරීමට ''හැකියාව'' ඇති කර ගත හැක්කේ ගිණුම් තැබීම හා පාලනය ස්ථාපිත කිරීමෙනි! උසාවි ප්‍රමාණවත් තරමින් දැඩි නොවීම තවත් කාරණයකි. අල්ලස් ගන්නවුන් වෙඩි තැබීමට නියම කරනවා වෙනුවට ඔවුහු ඔවුන්ට හය මසක සිර දඬුවමක් නියම කරති. මෙම වැරදි දෙකටම ඇත්තේ එකම සමාජමය ප්‍රභව මූලය ය. එනම්, සුළු ධනපති ගති ලක්ෂණයේ බලපෑම සහ එහි නොදැඩි ගතිය ය.

නොදියුණු බටහිර යුරෝපීය රටවත් වඩා පසුබා සිටින විට, එයින් පැන නගින විශෙෂ අංගලක්ෂනය ගැන සිතා නොබැලුවේය. වර්තමාන තත්වයේ එම විශේෂ ස්වභාවය නිසාම, සෝවියට් බලයට සේවය කිරීමට බැඳිමට සහ හැකි විශාලම පරිමාණයෙන් ''රාජ්‍ය'' නිෂ්පාදනය සංවිධානය කිරීමට ආධාර දීමට කැමැති ධනපතියන් අතර සිටින ඉතාමත් සදචාරවත්, ඉතාමත් කුසලතා පූර්ණ, ඉතාමත් දක්ෂ අය ''මිළට ගැනීමේ'' විශේෂ ක්‍රමයක් සහ කම්කරුවන් ඒ අනුව යෝජනා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පැනනගින බව පැහැදිලි නොවේ ද? මෙම විශේෂ තත්වය යටතේ අප වැරදි දෙකක් මග හැරීමට සැම ප්‍රයත්නයක්ම දැරිය යුතු බවත්, එම වැරදි දෙකම සුළු ධනපති ස්වභාවයේ ඒවා බවත්, පැහැදිලි නොවේ ද? එක් අතකින් අපගේ ආර්ථික ''බලවේග'' සහ අපගේ දේශපාලන ශක්තිය අතර නොගැලපීමක් තිබෙන නිසා අප බලය අල්ලා නොගත යුතුව තිබිණි යයි කීම මරණීය වරදක් වනු ඇත.[7] එවැනි තර්කයක් ඉදිරිපත් කිරීමෙහි සමත් වන්නේ, ඒ ආකාර ''නොගැලපීමක්'' සැම විටම පවතින බවත්, ස්වභාව ධර්මයේ සංවර්ධනයේදී මෙන්ම සමාජ සංවර්ධනයේදීද එය දක්නට ලැබෙන බවත්, සියළුම රටවල නිර්ධන පංත්තිකයන්ගේ විප්ලවීය සහයෝගය ඇතිව පූර්ණ සමාජවාදය නිර්මාණය කෙරෙනු ඇත්තේ තනි තනිව ගත් කල එක පැත්තකට බරවූ සහ යම් යම් දුර්වලකම් සහිත ප්‍රයත්න මාලාවක් මගින් බවත්, අමතක කරන ''මජ්ලර් කාරයෙක්''[8] පමණකි.

අනිත් අතට, ''ඇස් නිලංකාර කරන'' විප්ලවවාදී ජීවගුණයෙන් මෝහනය වන, එහෙත් පරිවර්තනයේ ඉතාමත් දුෂ්කර අවධි ගැන සැලකිල්ලට ගනිමින් නොකඩවාම, කල්පනාකාරී ලෙස සහ උවමනාවෙන් කළ යුතු විප්ලවකාරී වැඩ කිරීමේ හැකියාව නැති සෝෂා කාරයන්ට සහ වදන් හරඹ කරුවන් කැමති පරිද්දෙන් කටයුතු කිරීමට ඉඩ හැරීමද වරදක් බව පැහැදිලි ය.

වාසනාවකට මෙන්, විප්ලවවාදී පක්ෂවල සංවර්ධනයේ සහ ඒවාට විරුද්ධව බොල්ෂෙවික්වාදය කළ අරගලයේ ඉතිහාසය විසින් පැහැදිලි ලෙස වෙන් කොට දැක්වෙන වර්ග පිළිබඳ උරුමයක් අපට ලැබී තිබේ. එම වර්ග අතුරෙන් වාම සමාජවාදී-විප්ලවවාදීහු සහ අරාජිකවාදීහු නරක විප්ලවවාදීන් පිළිබඳ සිත් කාවදින ආදර්ශ වෙති. දැන් ඔවුහු ''දක්ෂිණ බොල්ෂෙවික්වරුන්ගේ'' ''සම්මුතියට'' විරුද්ධව සන්නියක් වැළඳුනු කලෙක මෙන් කෑගසති, හුස්ම හිරවෙන තරමට හා උගුර බැරැඞි වන තෙක් කෑගසති. නමුත් ''සම්මුතියෙහි'' නරක දෙය කුමක් ද යනුත්, ඉතිහාසය සහ විප්ලවයේ ගමන් මග විසින් ''සම්මුතිය'' යුක්ති යුක්ත

ලෙස හෙළා දකින ලද්දේ මන්ද යනුත්, සිතා ගැනීමට පුළුවන් කමක් ඔවුනට නැත.

කෙරෙන්ස්කිගේ කාලයේදී සම්මුති ගත වීම යනු බලය අධිරාජ්‍යවාදී ධනපති පංතියට හිමි කර දීමක් හා සමාන විය. බලය පිළිබඳ ප්‍රශ්නය සෑම විප්ලවයකම මූලික ප්‍රශ්නය වන බව මෙහි දී මතක තබා ගත යුතුය. 1917 ඔක්තෝබර්-නොවැම්බර් සමයේදී බොල්ෂෙවික්වරු කොටසක් සම්මුති ගත වීමෙන් අදහස් කෙරුණේ නිර්ධන පංතිය බලය අල්වා ගැනීම ගැන ඔවුන් බිය වූ බව හෝ, එසේ නැතහොත්, වාම සමාජවාදී-විප්ලවවාදීන් වැනි ''අවිශ්වාසදායක සහචරයන්'' සමග පමණක් නොව, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හැරීම, බගයෙව්ස්කිල, නිර්දය ලෙස මර්දනය කිරීම, සෑම තන්හිම සෝවියට් ආයතන පිහිටුවීම හා රාජ්‍ය සන්තක කිරීමේ සෑම කටයුත්තක්ම වැනි මූලික කටයුතුවලදී-අපට අනිවාරණීය වශයෙන්ම බාධාවක් වන්නට තිබුණු චෙර්නොව්වාදීන් සහ මෙන්ෂෙවික් වරුන් වැනි සතුරන් සමගද සමසේ බලය බෙදා ගැනීමට ඔවුන් කැමැත්තක් දැක්වූ බවය.

දැන් ''අවිශ්වාසදායක සහචරයන්'' නොමැතිව පවා බලය අල්වාගෙන, එය එක පක්ෂයක, එනම්, නිර්ධන පංතියේ පක්ෂය අතෙහි තහවුරු කර තිබේ, බලය බෙදා ගැනීමේ, නැතහොත්, ධනපති පංතිය යටකරන නිර්ධන පංති ආඥාදායකත්වය අත් හැර දැමීමේ ප්‍රශ්නයක් පැන නැග නැති හා කිසිසේත් පැන නැගිය නො හැකි වර්තමාන අවස්ථාවේ සම්මුතිය ගැන කථා කිරීම යනු කටපාඩමෙන් උගත් එහෙත් වටහා නොගත් වචන ගිරා තාලයෙන් පුනරුච්චාරනය කිරීමක් පමණකි. රට පාලනය කිරීමට හැකි සහ පාලනය කළ යුතු තත්වයට පැමිණි අප, ධනපති ක්‍රමය විසින් පුහුණු කරන ලද ඉතාමත් දක්ෂ පිරිස් කුඩා දේපල හිමි ක්‍රමයට විරුද්ධව අපේ පැත්තට දිනා ගැනීමට, වියදම් ගැන අදිමදි නොකර ප්‍රයත්න දරන විට, එය ''සම්මුති'' ගත වීමක් ලෙස විස්තර කිරීමෙන් හෙළිදරව් වන්නේ, සමාජවාදය ගොඩ ගැනීමේ ආර්ථික කර්තව්‍යයන් ගැන සිතීමට හැකියාවක් කොහෙත්ම නොමැති බව ය.

එනිසා කරේලින් සහ ගේ තමන්ට කළ ''සේවය'' ගැන බුහාරින් සහෝදරයා මධ්‍යම විධායක කාරක සභාවේදී ''ලජ්ජා වීම'' ඔහුගේ ගරුත්වයට හේතු වන නමුදු ''වාම කොමියුනිස්ට්'' උපනතිය හා සම්බන්ධයෙන් වූ කල, ඔවුන්ගේ අතගත් දේශපාලන සහෝදරවරු ගැන කර තිබෙන ප්‍රකාශය තවමත් බලවත් අනතුරු හැඟවීමක් ලෙසට පවතී.

නිදසුනක් ලෙසට වාම සමාජවාදී-විප්ලවවාදීන්ගේ නිල ප්‍රකාශනය වන ''ස්නාමියා තෘද'',[9] එහි 1918 අප්‍රියෙල් 25 කලාපයෙන් කළ මෙම සාඩම්බර ප්‍රකාශය ගනිමු. ''අපගේ පක්ෂයේ වර්තමාන ස්ථාවරය බොල්-

මෙන්ෂෙවික්වාදයේ නවත් උපනතියක (බුහාරින්, පක්රොව්ස්කි සහ නවත් අය) ස්ථාවරය සමග සම්පාත වන්නේය.'' එසේ නැතහොත්, වෙනත් ලිපිද අතර, අපකීර්තිමත් මෙන්ෂෙවික්වර ඉසුව් විසින් ලියන ලද පහත දැක්වෙන ''ප්‍රවාදය'' ඇතුලත්, මෙන්ෂෙවික්වාදී ''වපිරියොද්'' ප්‍රකාශනයේ එම දිනයේම කලාපය ගනිමු:

''ආරම්භයේ පටන්ම නියම නිර්ධන පංති ස්වරූපයකින් තොර වූ සෝවියට් බලයේ ප්‍රතිපත්තිය මෑත දී පටන් වඩ වඩාත් විවෘත ලෙසම ධනපති පංතිය සමග සම්මුතිගත වීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් පැහැදිලි කම්කරු පංති විරෝධී ස්වභාවයක් ගත්තේය. කර්මාන්ත ජනසතු කිරීමේ මුවාවෙන් ඔවුහු කාර්මික සංගත ව්‍යාපාර ස්ථාපිත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරති. එසේම, රටේ නිෂ්පාදනීය බලවේගය යළි පණ ගැන්වීමේ මුවාවෙන් ඔවුහු පැය අටේ වැඩ දිනය අවලංගු කිරීමටද, කෑලි ගණනේ වැඩ ක්‍රමය සහ ටේලර් ක්‍රමයත්, අපලේඛන සහ නරක සහතික මගින් දඬුවම් කිරීමත් ආරම්භ කිරීමට උත්සාහ කරති. නිර්ධන පංතියේ ඉතාමත් වැදගත් ආර්ථික ජයග්‍රහණයන් එයට අහිමි වී යාමේ සහ එය ධනපති පංතියේ අබාධිත සූරාකෑමට ගොදුරු වීමේ තර්ජනය මෙම ප්‍රතිපත්තියෙන් මතුවේ''.

මෙය පුදුම සහගත නොවේ ද?

රුසියානු ධනපතියන්ට රටවල් අල්ලා ගැනීමේ ප්‍රතිඥාව දුන් රහස් ගිවිසුම් වෙනුවෙන් කෙරෙන්ස්කි සමග එක්ව අධිරාජ්‍යවාදී යුද්ධයක් ගෙන ගිය ඔහුගේ හිත මිතුරන්ද, ජුනි 11 දින කම්කරුවන් නිරායුධ කිරීමට තර්ජනය කළ ට්සෙරතෙලිගේ සගයන්ද[10], මහා ශාබ්දික වදන් කඩතුරාවක් කොට ගනිමින් ධනපති පංතියේ පාලනය ආරක්ෂා කළ ලිබෙර්දන්ලා[11] ද වන මේ මිනිසුන්ම නොවේද, ''ධනපති පංතිය සමග සම්මුති ගත වීම'' ගැන, සංගත ව්‍යාපාර පිහිටුවීම ගැන (එනම්, රාජ්‍ය ධනපති ක්‍රමය පිහිටුවීම ගැන!) ටේලර් ක්‍රමය ආරම්භ කිරීම ගැන සෝවියට් බලයට චෝදනා කරන්නේ.

ඇත්ත වශයෙන්ම බොල්ෂෙවික්වරු ඉසුව්ට පදක්කමක් ප්‍රදානය කළ යුත්තාහ. එසේම ඔහුගේ ප්‍රවාදය ධනපතියන්ගේ ප්‍රකෝපකාරී කථා පිළිබඳ නිදර්ශනයක් ලෙසට සෑම කම්කරු සමාජයකම ප්‍රදර්ශනය කිරීම වටී. මේ ලිබෙර්දන්ලා, ට්සෙරතේලිලා සහ ඉසුව්ලා කවුද යනු දැන් කම්කරුවෝ හොඳින් දනිති. කම්කරුවෝ අත් දැකීමෙන් ඔවුන් ගැන දනිති. ධනපති පංතියේ එවැනි අන්තේවාසිකයන් ටේලර් ක්‍රමයට සහ ''සංගත ව්‍යාපාර පිහිටු වීමට'' විරුද්ධවන ලෙස කම්කරුවන් උසිගන්වන්නේ මන්ද යන්න ගැන සිතා බැලීම ඇත්ත වශයෙන් ම කම්කරුවන්ට ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත.

ලිබර්දන්ලාගේ සහ ටසෙරතේලිලාගේ මිතුරෙක් වන ඉසුව්ගේ ''ප්‍රවාදය'' ''වාම කොමියුනිස්ට්වාදින්'' ගේ පහත සඳහන් ''ප්‍රවාදය'' සමග සුපරික්ෂාකාරී ලෙස සංසන්දනය කර බැලීමට පංති විඥානය ඇති කම්කරුවෝ පෙළඹෙති:

''කර්මාන්තය තුළ ධනපතින්ගේ කළමණාකරණය යළි ස්ථාපිත කිරීම හා සම්බන්ධයෙන් ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රම ඵලදායකත්වයේ සැලකිය යුතු වැඩි වීමක් සිදු නොවේ. නමුත් එයින් සිදු වනු ඇත්තේ නිර්ධන පංතියේ පංති ක්‍රියාරම්භකත්වය, ක්‍රියා කාරිත්වය හා සංවිධානය හීන වීමය. කම්කරු පංතිය වහල් කිරීමේ තර්ජනයක් එයින් මතු වේ. එය නිසා නිර්ධන පංතියේ නොදියුණු කොටස් අතර මෙන්ම පෙරමුණු කොටස් අතරද අප්‍රසාදය පැන නගිනු ඇත. ''ධනපති කඩාකප්පල් කාරයන්ට'' විරුද්ධව නිර්ධන පංතිය අතර බලපවත්වන වෛරය මධ්‍යයේ මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනු පිණිස, කම්කරුවන්ට ප්‍රතිපාක්ෂික ආකාරයකින් සුළු ධනපතියන් කෙරෙහි විශ්වාසය තැබීමට කොමියුනිස්ට් පක්ෂයට සිදු වනු ඇත. මේ ආකාරයෙන් එය නිර්ධන පංතියේ පක්ෂය ලෙසට තමන් විනාශ කර ගනු ඇත'' (''කොමියුනිස්ට් අංක 1, පිටු 8, තීරුව 2).

''වාම'' වාදින් උගුලෙහි අසු වී ඇති බවටත්, ඉසුව් ලා සහ ධනපති ක්‍රමයේ වෙනත් ජුදස්ලා විසින් තමන් ප්‍රකෝප කරනු ලැබීමට ඉඩ දී තිබෙන බවටත් මෙය කදිම සාධකයකි. ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීමට පක්ෂ වන්නේ නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියම බව සහ මෙම විනය අවුල් වියවුල් කර දැමීමට හැකි සියල්ලක්ම කරන්නේ ඉදුරාම සුළු ධනපති පංතිකයන්ම බවත් දන්නා කම්කරුවන්හට මෙය අගේ ඇති පාඩමක් වන්නේය. ඉහත උපුටා දක්වන ලද ''වාම'' වාදින්ගේ ප්‍රවාදය වැනි කථා මහා අපවාදයක් සහ ව්‍යවහාරයෙන් කොමියුනිස්ටවාදය අත් හැර දැමීමක්ද, සම්පූර්ණයෙන්ම සුළු ධනපති පංතියේ කඳවුරට පලා යාමක් ද වේ.

''ධනපතින්ගේ කළමණාකරණය යළි ස්ථාපිත කිරීම හා සම්බන්ධයෙන්'' — ''වාම කොමියුනිස්ටවාදීන්'' ''තම ආරක්ෂාව සලසා ගැනීමට'' බලාපොරොත්තු වන්නේ මෙවැනි වචනවලිනි. එහෙත්, ප්‍රථමයෙන්ම සෝවියට් බලය ''කළමණාකරණය'' ධනපතියන් අතට පත් කරන විට කළමණාකරු ගැන පියවරක් පියවරක් පාසා සෝදිසියෙන් සිටීමට කම්කරු කොමිසාර්වරු, නැතහොත්, කම්කරු කාරක සභා පත් කරන අතර එම කොමිසාර්වරු, නැතහොත්, කාරක සභා කළමණාකරුගේ පළපුරුද්දෙන් උගෙන ගන්නා හෙයින් සහ ඔවුනට ඔහුගේ නියමයන්ට විරුද්ධව ආයාචනා කිරීමේ අයිතිය පමණක් නොව සෝවියට් බලයේ

ආයතන මගින් ඔහු ඉවත් කර වීමේ බලය ද ඇති හෙයින් ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ'' එම ආරක්ෂාව කිසිම වැඩකට නැති එකකි. දෙවැනිව, ධනපතියන්ට ''කළමණාකරණය'' පවරා තිබෙන්නේ වැඩ කරන විට ඉටු කරන විධායක කාර්යයන් සම්බන්ධයෙන් පමණකි. එසේම වැඩ කිරීම හා සම්බන්ධ කොන්දේසි සෝවියට් සභා විසින් නියම කර තිබෙන අතර, එම කොන්දේසි අවලංගු කිරීමට හා වෙනස් කිරීමට ද පුළුවන. තුන්වැනිව සෝවියට් බලය ධනපතියන්ට ''කළමණාකරණය'' භාර දෙන්නේ ඔවුන් ධනපතියන් වශයෙන් ගෙන නොව වැඩි වැටුපට සේවය සඳහා බඳවා ගත් කාර්මික ශිල්පීන් සහ සංවිධායකයන් වශයෙන් සලකාය. තවද, සැබැවින්ම මහා පරිමාණ සහ යෝධ ව්‍යවසායවල සංගතවල හෝ වෙනත් ආයතනවල සංවිධායකයන් සහ පළමු පෙළේ කාර්මික ශිල්පීන් අතුරෙන් සියයට අනූනවයක්ම ධනපති පංතියට අයත් බව කම්කරුවෝ හොඳින් දනිති. නමුත්, ශ්‍රම ක්‍රියාදමයේ ''කළමණාකරණය'' සහ නිෂ්පාදනය සංවිධානය කිරීම සඳහා අපට, නිර්ධන පංති පක්ෂයට පත් කිරීමට සිදු වී තිබෙන්නේ මේ මිනිසුන් මය. එයට හේතුව මෙම විෂයෙහි දී ප්‍රායෝගික පළපුරුද්ද ලැබූ වෙනත් අය නොමැති වීමය. කම්කරුවෝ ''වාම'' වාදීන්ගේ වදන්වලින්, නැතහොත්, ලිහිල් සුළු ධනපති සංකල්පවලින් නොමඟ යාමට හේතු සාධක වූ ළදරුභාවය ඉක්මවා වර්ධනය වී සමාජවාදය දෙසට ඉදිරියට ගමන් කරමින් සිටිති. ඔවුන් එසේ ඉදිරියට යන්නේ ඉඳුරාම සංගත ව්‍යාපාර ධනපති ක්‍රමයෙන් කළමණාකරණය කිරීම මගිනි; යෝධ යන්ත්‍ර කර්මාන්තය මගිනි; කෝටි ගණනක වාර්ෂික පිරිවැටුමක් ඇති ව්‍යවසායයන් මගිනි; එවැනි නිෂ්පාදන ක්‍රමයක් සහ එවැනි ව්‍යවසායයන් මගින් පමණකි. ඔවුහු මහා පරිමාණ ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' බිය නොවෙති. සුළු දේපල ආකාරයේ කැබලි වීමට සහ අසංවිධානයට විරුද්ධව තම සෝවියට් බලය විසින් යොදා ගනු ලබන තමන්ගේ නිර්ධන පංති අවියක් ලෙසට කම්කරුවෝ එය අගය කරති.

මෙය වටහා ගත නොහැක්කේ පංතියෙන් පිට ඇමුනු සහ එනිසා අත්‍යන්තයෙන්ම සුළු ධනපති වූ බුද්ධමතුන්ට පමණකි. ''වාම කොමියුනිස්ටවාදීන්'' ගේ කණ්ඩායම එවැන්නකි. ඔවුන්ගේ සඟරාවෙහි පහත සඳහන් පරිදි ලියන ඔසින්ස්කි ද එවැන්නෙකි.

''... ඕනෑම ව්‍යවසායයක් සංවිධානය කිරීමේදී සහ කළමණාකරණය කිරීමේදී මුළු ක්‍රියාරම්භකත්වයම ''සංගත ව්‍යාපාරවල සංවිධායකයන්'' සතුව පවතී. අප කරන්නට යන්නේ ඔවුනට උගැන්වීම, නැතහොත්, ඔවුන් සාමාන්‍ය කම්කරුවන් බවට පත් කිරීම නොවේ. අපි ඔවුන්ගෙන් උගෙන ගැනීමට යන්නෙමු'' (''කොමියුනිස්ට්'' අංක 1, පිටු 14, තීරුව 2).

මෙහි උපහාසයට ලක් කිරීමට උත්සාහ කර ඇත්තේ ''සංගත ව්‍යාපාරවල සංවිධායකයන්ගෙන් සමාජවාදය උගෙන ගන්න'' යන මගේ වචනය.

මෙය විහිළුවක් යයි ඔසින්ස්කි සිතයි. සංගත ව්‍යාපාරවල සංවිධායකයන් ගෙන් ''සාමාන්‍ය කම්කරුවන්'' තැනීමට ඔහුට උවමනා කර තිබේ. ''අවුරුදු පහළොවක්, පමණකි වැඩි නැත?..''[12] යනුවෙන් කවියෙක් සඳහන් කළ වයසේ මිනිසෙකු විසින් මෙය ලියන ලද නම් ඒ ගැන පුදුම වන්නට දෙයක් නැත. නමුත්, මහා පරිමාණ ධනපති ක්‍රමය විසින් නිර්මාණය කරන ලද ඉංජිනේරු කර්මාන්තවල සහ සංස්කෘතියේ ජයග්‍රහණ උපයෝගී කර නොගෙන සමාජවාදයක් ඇති විය නොහැකි බව උගෙන ගත් මාක්ස්වාදියෙකුගෙන් මෙවැනි කථාවක් අසන්නට ලැබීම විමතියට හේතුවකි. මෙහි නම් මාක්ස්වාදයේ සේයාවකුදු නැත.

නැත්තේමය. කොමියුනිස්ට් යන නම දැරීමට තරම් වන්නේ, සංගත ව්‍යාපාරවල සංවිධායකයන්ගෙන් උගෙන නොගෙන සමාජවාදය ඇති කිරීමට නැතහොත් ආරම්භ කිරීමට නොහැකි බව වටහා ගන්නා අය පමණකි. මන්ද යත්, සමාජවාදය යනු හුදෙක් පරිකල්පනයක් නොව, සංගත ව්‍යාපාර කළ නිර්මාණයන් තුළ බලය අල්වා ගත් නිර්ධන පංති පෙරමුණු බල ඇණිය විසින් ඒවා ස්වීකරණය කර ගැනීමක් සහ ක්‍රියාවට නැගීමක් වන හෙයිනි. නිර්ධන පංතියේ පක්ෂය වන අපට, සංගත ව්‍යාපාර ක්‍රියාමාර්ගය අනුව, සංගත ව්‍යාපාර සංවිධානය කර තිබෙන ලෙසට මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමේ දක්ෂකම් හිමි කර ගැනීම පිණිස, ප්‍රථම පෙළේ ධනපති විශේෂඥයන්ගෙන් එම ඇනුම ලබා ගැනීම හැර වෙනත් මාර්ගයක් නොමැත.

ධනපති බුද්ධිමතුන්ට සමාජවාදය ''උගැන්වීමේ'' බොළඳ කර්තව්‍යය අප භාරගතහොත් මිස, අප ඔවුන්ට උගැන්විය යුතු කිසිවක් නොමැත. අප කළ යුත්තේ ඔවුනට උගැන්වීම නොවේ, ඔවුන් අසන්තක කිරීමය. (ප්‍රමාණවත් ''අධිෂ්ඨානයකින්'' රුසියාවේ එය කරනු ලැබේ). අප කළ යුත්තේ ඔවුන්ගේ කඩා කප්පල් ක්‍රියාවන් නැවැත්වීම සහ ස්තරයක් හෝ කණ්ඩායමක් ලෙසට ඔවුන් සෝවියට් ලෙසට යටත් කිරීම ය. අනිත් අතට අපි, ළදරු වියේ පසුවන හා ළදරු අවබෝධයක් ඇති කොමියුනිස්ට්වාදීන් නොවන්නෙමු නම්, ඔවුන්ගෙන් උගෙන ගත යුත්තෙමු. කෝටි ගණන් ජනතාවන්ගේ උවමනාවන් ඉටුකිරීමට අවශ්‍යවන යෝධ ව්‍යවසායයන් සංවිධානය කිරීමේ ස්වාධීන වැඩ කටයුතු පිළිබඳ පළපුරුද්දක් නිර්ධන පංති පක්ෂයට හා එහි පෙරමුණු බල ඇණියට නොමැති හෙයින් උගෙන ගත යුතු යමක් ඇත.

රුසියාවේ විශිෂ්ටතම කම්කරුවන්ට මෙය වැටහී තිබේ. ධනපති

සංවිධායකයන්ගෙන්, කළමණාකාර ඉන්ජිනේරුවරුන්ගෙන් සහ කාර්මික ශිල්පීන්ගෙන් උගෙන ගැනීම ඔවුන් පටන් ගෙන ඇත. පහසු දෙයින් පටන් ගනිමින් ක්‍රමාණුකූල ලෙස දුෂ්කර දෑ වෙත යමින් ඔවුන් අනවරට ලෙස හා ප්‍රවේසම් සහිතව උගෙන ගැනීම ආරම්භ කර ඇත. යකඩ හා වානේ සහ ඉන්ජිනේරු කර්මාන්තවල මෙම කටයුතු වේගයෙන් අඩු බවක් පෙනෙන්නේ නම්, එයට හේතුව එහි දී මතුවන දුෂ්කරතාවයන් අධික වීමය. නමුත්, පේෂකර්ම සහ දුම්කොළ කම් කරුවන්ද, සම් පදම් කරන්නන්ද, පංතියෙන් පිටදැමුනු සුළු ධනපති බුද්ධිමතුන් මෙන් ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' හෝ ''සංගත ව්‍යාපාරවල සංවිධායකයන්ගෙන් උගෙන ගැනීමට'' හෝ බිය වන්නේ නැත. ප්‍රධාන සම් කාරක සභාව සහ මධ්‍යම පේෂ කර්ම කාරක සභාව වැනි මධ්‍යම නායක ආයතනවල සිටින මෙම කම්කරුවෝ, ධනපතියන් සමග එක පෙළට සිටිමින් තම කටයුතු කරති; ඔවුන්ගෙන් උගෙන ගනිති; සෝවියට් බලය යටතේ සමාජවාදයේ එළිපත්ත නියෝජනය කරන, එහි ස්ථිර ජයග්‍රහණය සඳහා කොන්දේසිය වන සංගත ව්‍යාපාර පිහිටුවති; රාජ්‍ය ධනපති ක්‍රමය පිහිටුවති.

රුසියාවේ දියුණු කම්කරුවන්ගේ මෙම කටයුතු සහ ඒ සමගම ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීමේ ඔවුන්ගේ කටයුතු ද ආරම්භ වී තිබේ. සමහර ''වාම'' වාදීන්ට නැතිවම බැරි ඝෝෂාව සහ කලබලය නැතිව, එම කටයුතු නිහඬ ලෙස හා ඉදිරියට පැනීමක් නැතිව කෙරී ගෙන යන්නේය. ප්‍රායෝගික අත් දැකීම්වලින් ලැබෙන පාඩම් සැලකිල්ලට ගනිමින්, එම කටයුතු ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස හා ක්‍රමානුකූල ලෙස ඉදිරියට යයි. අප නිවැරදි මාවතේ ගමන් කරන බවට සහතික වන්නේත්, රුසියාවේ පංති විඥනය ඇති කම්කරුවන් සුළු දේපල ක්‍රමයේ එන ලෙසට කැබලි වීමට හා අසංවිධානයට විරුද්ධව, සුළු ධනපතියන්ගේ විනය රහිත භාවයට විරුද්ධව* අරගලය කරගෙන යන බවට සහතිකය වන්නේත්, නැතහොත්, කොමියුනිස්ට් ක්‍රමයේ ජයග්‍රහණය පිළිබඳ සහතිකය වන්නේත්, මෙම අමාරු වැඩ කටයුතුය; මහා පරිමාණ නිෂ්පාදනය ගොඩ නැගීමට ප්‍රායෝගික වශයෙන් උගෙන ගැනීමේ කටයුතුය.

---

* ආර්ථික ක්ෂේත්‍රයෙහි දී නිර්ධන පංති ආඥදායකත්වයේ වැදගත් කම ගැන ප්‍රවාදවල කතු වරයා වචනයක්වත් කියා නොතිබීම ඉතාමත් ස්වභාව නිරූපිය. එහි සඳහන් කෙරෙන්නේ ''සංවිධානය'' යනාදිය ගැන පමණකි. නමුත් ආර්ථික සම්බන්ධකම් විෂයෙහි දී කම්කරුවන්ගේ ආඥදායකත්වය මග හරින සුළු ධනපතියෝද එය පිළිගනිති. ධනපති ක්‍රමයේ අඩිතාලම්වලට විරුද්ධව එල්ලකර තිබෙන නිර්ධන පංති විප්ලවයේ මෙම ''අරටුව'' මෙම අවස්ථාවේ දී ''අමතක කිරීම නිර්ධන පංති විප්ලවවාදියෙකුට කිසිසේත්ම නොකළ හැකිය.

## VI

අවසාන වශයෙන් කරුණු දෙකක් එකතුකරමු.

1918 අප්‍රියෙල් 4 දින "වාම කොමියුනිස්ට්වාදීන්" සමග තර්ක කිරීමේ දී ("කොමියුනිස්ට්" අංක 1, පිටු 4, පාසටහන බලන්න) මම එක එල්ලේම ඔවුන්ට මෙසේ කීවෙමි: "දුම්රිය ආඥාවෙහි[13] ඇති ඔබ නොකැමති දේ මොනවාදැයි පැහැදිලි කරන්න; එයට ඔබේ සංශෝධන ඉදිරිපත් කරන්න. එසේ කිරීම නිර්ධන පංතියේ සෝවියට් නායකයන් ලෙස ඔබගේ යුතුකම වන්නේය. ඔබ එසේ නොකරන්නෙහි නම්, ඔබ කියන්නක් හුදෙක් හිස් වදන් පමණක් වන්නේය."

ප්‍රථම "කොමියුනිස්ට්" කලාපය 1918 අප්‍රියෙල් 20 දින නිකුත් විය. නමුත්, "වාම කොමියුනිස්ට්වාදීන්" සිතන ලෙසට දුම්රිය ආඥාව වෙනස් විය යුත්තේ හෝ සංශෝධනය විය යුත්තේ හෝ කෙසේද යන්න ගැන එහි එක් වචනයක් වත් නොවීය.

"වාම කොමියුනිස්ට්වාදීහු" ඔවුන්ගේ ම නිශ්ශබ්ද භාවය විසින් හෙළා දකිනු ලැබ සිටිති. ඔවුන් කළේ නොයෙක් ආකාරයේ අවලාද නගමින් දුම්රිය ආඥාවට පහර දීම පමණකි. (අංක 1 හි පිටු 8 සහ 16). ආඥාව වැරදි නම් එය සංශෝධනය කළ යුත්තේ කෙසේ ද?" යන ප්‍රශ්නයට ඔවුන් නියම පිළිතුරක් දුන්නේ නැත.

ඒ ගැන විස්තර කිරීමක් අවශ්‍ය නැත. දුම්රිය ආඥාව ගැන කරන එවැනි "විවේචන" එක්කෝ "ඉසුව්වාදී" විවේචන ලෙසට, නැතහොත්, පුහු වදන් හරඹයක් ලෙසට පංති විඥානය ඇති කම්කරුවන් විසින් විස්තර කෙරෙනු ඇත (එම ආඥාව අපගේ ක්‍රියමාර්ගය, දැඩි භාවයේ ක්‍රියාමාර්ගය, ආඥාදායකත්වයේ ක්‍රියා මාර්ගය, නැතහොත් නිර්ධන පංති විනයේ ක්‍රියාමාර්ගය පිළිබඳ නියම නිදර්ශනයකි.).

දෙවැනි කරුණ. මගේ "රාජ්‍යය සහ විප්ලවය" යන පොත ගැන බුහාරින් සහෝදරයා ලියූ වර්ණනාත්මක සමාලෝචනයක් "කොමියු-නිස්ට්" පළමුවැනි කලාපයේ පළවිය. නමුත්, බුහාරින් වැනි අයගේ අදහස් ගැන මා කොතරම් අගය කළත් , මෙම සමාලෝචනයේ අංගලක්ෂණ නිසා එයින් ඛේදජනක සහ වැදගත් කරුණක් හෙළිදරව්වන බව නොකියා සිටීමට මගේ හෘදය සාක්ෂිය මට ඉඩ නොදේ. බුහාරින් නිර්ධන පංති ආඥාදායකත්වය ගැන සලකා බලන්නේ අතීතයේ ස්ථාවරයෙන් මිස අනාගතයේ ස්ථාවරයෙන් නොවේ. රාජ්‍ය පිළිබඳ ප්‍රශ්නයේදී නිර්ධන පංති විප්ලවවාදියාට සහ සුළු ධනපති විප්ලවවාදියාට පොදු විය හැකි දෙය සටහන් කරන බුහාරින් ඒ ගැන අවධාරණය කරයි. නමුත් ඒ දෙදෙන,

එකෙකුගෙන් අනිකා වෙන් කරන ඒ නියත කාරණයම බුහාරින්ට ''අමතක'' විය.

පැරණි රාජ්‍ය යන්ත්‍රය ''සුන් කර'' සහ ''පුපුරුවා'' දැමිය යුතුයයිද, ''අවසාන සහ සම්පූර්ණ වශයෙන්''ධනපති පංතියේ ''බෙල්ල අඹරවා දැමිය'' යුතු යයිද යනාදිය සටහන් කරන බුහාරින් ඒ ගැන අවධාරණය කරයි. වියරු වැටුනු සුළු ධනපතියන්ට ද මෙය අවශ්‍යව තිබිය හැක. 1917 ඔක්තෝබරය හා 1918 පෙබරවාරි අතර අපගේ විප්ලවය දැනටමත් ප්‍රධාන වශයෙන් කර තිබෙන්නේ මෙය ය.

එහෙත් ඉතාමත් විප්ලවවාදී සුළු ධනපතියාට වුවද අකමැති දෙය පංති විඥනය ඇති නිර්ධන පංති විප්ලවවාදියාට අවශ්‍ය වන දෙය, අපගේ විප්ලවය තවමත් ඉටු කර නොමැති දෙය, ආදිය ගැන මගේ පොතෙහි සඳහන් කර ඇත්තෙමි. මෙම කර්තව්‍ය ගැන, හෙට ඉටු කළයුතු කර්තව්‍යය ගැන බුහාරින් කිසි දෙයක් නොකීවේය.

මා මෙම කරුණ ගැන නිහඬ නොවීමට වැදගත් හේතු තිබේ. ඒ මෙසේය. ප්‍රථමයෙන්ම, ඊයේ කර්තව්‍යයන්ට නොව හෙට ඉටු කිරීමට තිබෙන කර්තව්‍යයන් ගැන වැඩි අවධාරණයක් යෙදීම කොමියුනිස්ට්වාදි-යෙකුගෙන් බලා පොරොත්තු වන දෙයකි. දෙවැනිව, මගේ පොත ලියන ලද්දේ, බොල්ෂෙවික්වරුන් බලය අල්ලා ගැනීමට පෙර වූ අතර, ''ඔව්, ඇත්ත තමයි, බලය අල්ලා ගැනීමෙන් පසුව අපි විනය ගැන කථා කරන්-නෙමු...'' යන වැනි පහත් සුළු ධනපති තර්කවලින් බොල්ෂෙවික් වරුන්ට සංග්‍රහ කිරීමට නො හැකි කාලයක් විය.

''ප්‍රචණ්ඩ භාවය සහ යටත් කිරීම නොමැතිව, සමාජ ජීවිතයේ මූලික කොන්දේසි පිළිපැදීමට ජනතාව පුරුදු වනු ඇති හෙයින්... සමාජවාදය කොමියුනිස්ට් ක්‍රමය දක්වා සංවර්ධනය වනු ඇත...''(රාජ්‍යය සහ විප්ලවය පිටු 77–78; බලය අල්ලා ගැනීමට පෙර ''මූලික කොන්දේසි'' ගැන සාක-ච්ඡා කරන ලද බව මෙයින් පෙනේ).

''... ප්‍රජාතන්ත්‍රවාදය හැකිළී යාමට පටන් ගනු ඇත්තේ ඉන් පසුව පමණකි...'' එවිට, ''ශතවර්ෂ ගණන් තිස්සේ දන්නා ලද සහ අවුරු දහස් ගණන් තිස්සේ නැවත නැවතත් කියන ලද ආප්තෝප දේශවල ඇතු ලත් සමාජ චර්යාව ගැනවූ මූලික නීති පිළිගැනීමට ජනතාව ක්‍රමානුකූල ලෙස පුරුදු වූ කල, බල කිරීම නොමැතිව, බලහත්කාරය නොමැතිව රාජ්‍යය නැමති බලහත්කාරයේ යන්ත්‍රය නොමැතිව එම නීති පිළි පැදීමට ඔවුන් පුරුදු වනු ඇත.'' (එම කෘතිය, පිටු 84; නැවත නැවතත් කියන ලද ආප්තෝපදේශ ගැන බලය අල්වා ගැනීමට පෙර සඳහන් කරන ලද බව මෙයින් පෙනේ).

''කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර (හැම එකාගෙන්ම ඔහුගේ

හැකියාව අනුව, හැම එකාටම ඔහුගේ අවශ්‍යතාවය අනුව) ඇති කිරීම සඳහා පැවතිය යුත්තේ වර්තමාන ශ්‍රම ඵලදායකත්වය නොවේ; පොම්යාලොව්ස්කි ගේ කථාවල එන සෙමිනෝරි[14] ශිෂ්‍යයන් මෙන් හුදෙක් විනෝදයට මහජන වස්තුව විනාශ කිරීමෙහි හා දීමට නොහැකි දෙයක්ම ඉල්ලීමෙහි සමත් වර්තමාන සාමාන්‍ය ස්වභාවයේ ජනයා නොවේ.'' (එම කෘතිය පිටු 91).

''කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර එන තෙක් ශ්‍රම ප්‍රමාණය සහ පාරිභෝජන ප්‍රමාණය හා සම්බන්ධයෙන් සමාජය සහ රාජ්‍යය විසින් දැඩිතම පාලනයක් පවත්වා ගත යුතුයයි සමාජවාදීහු කියති'' (එම කෘතිය).

''කොමියුනිස්ට් ක්‍රමයේ ප්‍රථම අදියර සූමට ලෙස ක්‍රියාත්මක වීමට, නිසි ලෙස ක්‍රියාත්මක වීමට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ ගිණුම් තැබීම සහ පාලනය ය. (එම කෘතිය, පිටු 95) එසේම මෙම පාලනය ස්ථාපිත කළයුත්තේ ''ඉතා සුළු පිරිසක් වන ධනපති අල්පතරය, නැතහොත් ස්වකීය ධනපති ගති සිරිත් රැක ගැනීමට කැමති මහත්වරුන් සම්බන්ධයෙන් පමණක් නොව, ''ධනපති ක්‍රමය විසින් ඉතාමත් නරක ලෙසට දූෂණය වී සිටින කම්කරුවන්'' (එම කෘතිය-පිටු 96) හා ''පරප්‍රාටවන්, එනම්, පොහොසතුන් ගේ, වංචාකාරයින් ගේ සහ ධනපති සම්ප්‍රදායයන් රකින වෙනත් ආරක්ෂකයන් සම්බන්ධයෙන් ද වේ.'' (එම කෘතිය).

බුහාරින් මෙය අවධාරණය නොකිරීම සැලකිල්ලට ගත යුතු කරුණකි.

1918 මැයි 5

1918 මැයි 9, 10 හා 11 දිනවල
''ප්‍රාව්ද'', අංක 88, 89 හා 90
කලාපවල පළකරන ලදී

1 ''කොමියුනිස්ට්'' — ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ නිල ප්‍රකාශනය වූ සතිපතා සඟරාවකි. මෙය 1918 ජූනි සිට අප්‍රියෙල් දක්වා මොස්කව්හි පළ විය. පළවූයේ කලාප 4 ක් පමණකි.

2 මෙම වචන ගෙන ඇත්තේ සල්තිකොව් — ෂෙද්‍රින්ගේ ''පිට පළාතක මිනිසෙකුගේ සාන්ත පීටර්ස්බර්ග් දිනපොත'' නැමති නව කථාවෙනි.

3 ග්‍රීක පුරාණයේ රූමත් තරුණයෙකි. ඔහු ජලය මත පතිතවූ තම පිළිබිඹු-වට ආලය කළේය. මෙම යෙදුම යොදනු ලබන්නේ තමාටම ආලයකරන්නන් හුවා දක්වීම සඳහාය.

4 ගොගොල්ගේ ''මළ ගිය ඇත්තෝ'' කථාවෙහි එන සාහසික ඉඩම් හිමි චරිතයක් වන ''නස්ද්‍රියොව්'' ගේ නම අනුව ගත් යෙදුමකි.

5 ජුන්කර්වරු — ප්‍රුසියාවේ ඉඩම් හිමි රදළවරු

6 ලෙනින් උපුටා දක්වන්නේ එංගල්ස් ''ප්‍රංශයේ සහ ජර්මනියේ ගොවිජන ප්‍රශ්නය'' යන කෘතියෙහි විස්තර කර තිබෙන මාක්ස්ගේ ප්‍රකාශයක් ගෙනි. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, මොස්කව් 1973, වෙළුම 3, පිටු 474)

7 මෙහි ලෙනින් සඳහන් කරන්නේ, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට හා නිර්ධන පංතියේ ආඥාදායකත්වයට විරුද්ධව මෙන්ෂෙවික්වරුන් ඉදිරිපත් කළ ප්‍රධාන කොන්දේසිවලින් එකක් පිළිබඳවය. එන්. සුඛානව්ගේ ''විප්ලවය ගැන සටහන්'' නැමැති පොතින් මෙන්ෂෙවික්වරු එම ප්‍රතිවිප්ලවවාදී අදහස් ඉදිරිපත් කළහ. ලෙනින් ''අපගේ විප්ලවය ගැන (එන් සුඛානව්ගේ ලිපි ගැන)'' නැමැති ලිපියෙන් එම පොත දැඩි විවේචනයට ලක්කළේය.

8 මජ්ලර් කාරයා — රුසියානු ගත්කතුවරයක් වන ඒ. පී. චෙහව් ලියූ එම නමින් යුත් කථාවේ එන චරිතයකි. එය සියළු නවතාවයන් ක්‍රියාරම්භකතාවයන් පිළිකුල් කරන පටු අදහස් දරන අමනයකුගේ පිළිබිඹුවකි.

9 'ස්නාමිය තෲද' — එස්එර්වරුන්ගේ දිනපතා පළවූ ප්‍රධාන පුවත්පත. 1917 සැප්තැම්බර් සිට පළ විය. 1917 දෙසැම්බර් සිට එය වාමාංශික එස්එර් පක්ෂයේ ප්‍රධාන පත්‍රය බවට පත්විය. 1918 වාමාංශික එස්එර්වරුන්ගේ කැරැල්ල අවස්ථාවේ පත්‍රය තහනම් කරන ලදී.

10 මෙහි අදහස් වන්නේ, 1917 ජුනි 11(24) දින සෝවියට් සභාවල පළමුවැනි සමස්ත-රුසියා සම්මේලනයේ සභාපති මණ්ඩලයේද, පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දාදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ විධායක කාරක සභාවේද, ගොවි නියෝජිත සෝවියට් සභාවේ විධායක කාරක සභාවේ හා සම්මේලනයේ සියළුම කණ්ඩායම්වල බියුරෝවේද ඒකාබද්ධ සාකච්ඡා සභාවේදී තාවකාලික රජයේ ඇමැති ට්සෙරතේලි විසින් පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ගේ හා සොල්දාදුවන්ගේ සාමකාමී පෙළපාලිය පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේදී කරන ලද කථාව ගැනය. ට්සෙරතේලිගේ කථාව අපවාද සහගත ප්‍රතිවිප්ලවවාදී එකක් විය. රජයට විරුද්ධව කරන කුමන්ත්‍රණ පිළිබඳ හා ප්‍රතිවිප්ලවවාදී කටයුතු පිළිබඳ බොල්ෂෙ-

වික්වරුන්ට චෝදනා කළ ඔහු බොල්ෂෙවික්වරුන් සමග එකතුව යන කම්කරුවන් නිරායුධ කිරීම සඳහා තීරණාත්මක පියවරයන් ගන්නා බවටද තර්ජනය කළේය.

11 ''ලිබර්දන්වරු'' — මොස්කව් බොල්ෂෙවික් පුවත්පත වූ 'සොට්සල් ඩිමොක්‍රැට්' හි දෙමියාන් බෙද්නි විසින් පළ කරන ලද ''ලිබෙර්දන්'' නැමැති උපහාසාත්මක ලිපියට පසු, මෙන්ෂෙවික් නායකයින් වන ලිබෙර් හා දන් ඇතුළු ඔවුන්ගේ සගයින්ට පටබැඳි උපහාසාත්මක නාමය.

12 ලෙනින් මෙම වචන ගෙන තිබෙන්නේ, ඒ. එ ස්. පුෂ්කින්ගේ කාව්‍යයකිනි. සූර්යයාට අධිපති දෙවියා සහ කලාවන්ගේ ආරක්ෂකයා වන පිබස් අපලෝන් වෙත අවිශිෂ්ට කවියෙකු විසින් යවන ලද ඔහුගේ කවි ගැන වූ පුෂ්කින්ගේ කාව්‍යය කෙළවර වූයේ පහත සඳහන් වචනවලිනි.

ඔහු කියවද්දී ඇනුමක් පිටකළ පිබස් මෙසේ ඇසිය.
මේ කවිකාරයාගේ වයස කීයද?
ඔහු මෙම ගෙරවිලි පද බැඳීමට කොතරම් කලක් ගෙවී ද?
''ඔහු අවුරුදු පසළොසකි'' යි එරාටෝ පිළිතුරු දුනි.
''නමුත් අවුරුදු පසළොසකි'', ''වැඩිනැත? මා ස්වාමීනි''.
''එසේනම් ඉපළ ඔහුගේ තැග්ග විය යුතුය''.

13 27 වැනි සටහන බලන්න.

14 බුර්සාක්වරු — ආගමික පාසලක ශිෂ්‍ය පූජකවරු. ශිෂ්‍යාගාරයක (බුර්සා) මොවුහු ජීවත් වූහ. දැඩි විනයකට යටත්ව සිටි මොවුන්ට දැඩි හා කෲර වදබන්දන පමුණුවන ලදී. ඔවුන් ගැන රුසියානු ගත්කතුවරයෙකු වූ එන්. ජී. පමියලොව්ස්කිගේ ''බුර්සා කථා'' හි ලියා ඇත.